## ඌව පළාත් සභාව - 2011

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

(අ) **පළාත් සභා අරමුදල් ගිණුම**

සමාලෝචිත වර්ෂයේ පළාත් සභා අරමුදල් ගිණුම 2012 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කරන ලදි.

(ආ) **අනෙකුත් ගිණුම්**

සමාලෝචිත වර්ෂයට අදාලව 2012 මාර්තු 31 දිනට පළාත් සභාවේ අනෙකුත් ගිණුම් ඉදිරිපත් කිරීමේ ප්‍රගතිය පහත දැක්වේ.

| | | 2011 වර්ෂයට අදාල | | | |
|---|---|---|---|---|---|
| | | මුළු ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත් කළ ගිණුම්සංඛ්‍යාව | ඉදිරිපත් නොකළ ගිණුම්සංඛ්‍යාව | ඉකුත් වර්ෂ වලට අදාලව ඉදිරිපත් නොකළ ගිණුම් සංඛ්‍යාව |
| (i). | විසර්ජන ගිණුම් | 27 | 27 | නැත | නැත |
| (ii). | ආදායම් ගිණුම් | 01 | 01 | නැත | නැත |
| (iii). | පළාත් සභා නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් | 28 | 24 | 04 | 14 |
| (iv). | වානිජ අත්තිකාරම් ගිණුම් | 09 | 04 | 05 | 04 |
| (v). | අරමුදල් ගිණුම් | 09 | 04 | 05 | 34 |
| (vi). | ප්‍රඥාප්ති ගිණුම් | 03 | නැත | 03 | 28 |

1.2 **මතය**

මෙම වාර්තාවේ ඇතුලත් මාගේ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් හේතු කොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති ඌව පළාත් සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

ඌව පළාත් සභා මුද්‍රණාලයේ මූල්‍ය ප්‍රකාශන සමඟ මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණි.

### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත් සභාවේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා කාර්යාල 13 ක 2011 දෙසැම්බර් 31 දිනට බැරකම් රු. 4,479,491 ක් විසර්ජන ගිණුම්වල DGSA 9 බැරකම් පිළිබඳ ප්‍රකාශයේ දක්වා නොතිබුණි.

(ආ) පළාත් ආදායම් කොමසාරිස් නමින් පවත්වාගෙන යනු ලබන රැස්කිරීමේ ජංගම ගිණුම්වල එකතුව රු. 36,738,329 ක් ඌව පළාත් සභා අරමුදලට අයත් ප්‍රධාන ජංගම ගිණුමට බැර කිරීමට කටයුතු කර නොතිබුණු අතර එම ආදායම් සමාලෝචිත වර්ෂයේ ඒකාබද්ධ ආදායම් ගිණුමෙන් හා අවසාන මූල්‍ය ප්‍රකාශනයෙන් අත්හැර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා ඌව පළාත් ප්‍රධාන අමාත්‍ය, මුදල්,ක්‍රම සම්පාදන, නීතිය හා සාමය පළාත් පාලන, අධ්‍යාපන, ප්‍රවාහන, සංස්කෘතික කටයුතු, ඉඩම්, වාරිමාර්ග,ආර්ථික ප්‍රවර්ධන, ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන හා ඉදිකිරීම් අමාත්‍යාංශය වෙත ලබාදෙන ලද, පළාත් මූල්‍ය කළමනාකරණ දෙපාර්තමේන්තුව වෙත ආපසු හරවා යවන ලද රු. 22,000,000 ක් වූ අග්‍රිමය පිළිබඳ, අග්‍රිම ලැබීම් හා ගෙවීම් ගිණුමෙන් අනාවරණය කර නොතිබුණි.

(ඈ) වර්ෂ ගණනාවක සිට ඌව පළාත් අවසන් මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය වත්කම් යටතේ පෙන්නුම් කරන සමාජ සුභසාධන අරමුදලට අදාල ජංගම ගිණුම, 2011 අගෝස්තු 11 දින බැංකුව විසින් ගිණුම වසා දමා 2010 දෙසැම්බර් 31 දිනට ශේෂය වූ රු. 53,748 ක් සමාජ සේවා දෙපාර්තමේන්තුව වෙත ආපසු ලබාදී ඇති නමුත් 2011 දෙසැම්බර් 31 දිනට පළාත් සභා අවසන් මූල්‍ය ප්‍රකාශයනවල මූල්‍ය වත්කම් යටතේ එහි ශේෂය රු. 100,000 ක් ලෙස දක්වා තිබුණි.

(ඉ) 2011 වර්ෂය තුළ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ගෙවූ රු. 633,100,557 න් රු.296,182,934 ක් 2011 වර්ෂයේ ලැබීම් මත කළ ගෙවීම් වන අතර ඉතිරි රු.336,917,623

ක මුදල 2011 ජනවාරි 01 දිනට වූ ශේෂය පියවීම සඳහා ගෙවා තිබුණි. ඒ අනුව 2011 ජනවාරි 01 දිනට වැරදි නිවැරදි කිරීමෙන් පසු ශේෂය වන රු. 310,625,713 ක් පියවීම වෙනුවෙන් රු. 336,917,622 ක් ගෙවා තිබුණි. මේ අනුව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත වැඩිපුර ගෙවූ මුදල රු. 26,291,909 ක් විය.

(ඊ) දීර්ඝ කාලයක සිට මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය වත්කම් වශයෙන් දක්වා ඇති කෘෂිකර්ම අමාත්‍යාංශයේ බීජ අර්තාපල් ගිණුම රු. 42,501,491 ක්, ව්‍යාජ වත්කම් වශයෙන් දක්වා ඇති කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වැටුප් මුදල් අතුරුදහන්වීම රු. 1,035,989 ක් 1990 සිදුවූ මූල්‍ය අංශයේ මුදල් වංචාව රු. 595,000 සහ වගකීම් වශයෙන් දක්වා ඇති සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ගෙන් ලැබී තිබුණ ණය මුදල රු. 4,300,000 ක් 2011 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(උ) දීර්ඝ කාලයක සිට අක්‍රීයව පවතින පළාත් රාජ්‍ය නිලධාරීන්ට ණය අත්තිකාරම් ගිණුම් 08 ක හර ශේෂ එකතුව වූ රු. 8,575,743 ක් හා බැර ශේෂ 03 ක එකතුව රු. 1,115,681 ක් 2011 දෙසැම්බර් 31 වන විටත් නිරවුල් කර නොතිබුණි.

(ඌ) වාණිජ අත්තිකාරම් ගිණුම් 02 කට අදාලව 2007 වර්ෂයේ සිට පැවත එන රු. 26,550,202 ක් වූ නිරවුල් නොකළ හර ශේෂය 2011 දෙසැම්බර් 31 දිනවන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(එ) පළාත් කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සත්ව නිෂ්පාදන, මිරිදිය ධීවර කර්මාන්ත, පරිසර සහ සංචාරක කටයුතු අමාත්‍යාංශයට අයත් කැබ් රථයකට 2011 මැයි 26 දින සිදුවූ අනතුරෙන් ඇති වූ රු.496,605 ක පාඩුව ඩී.පී.එස්.ඒ - 8 ආකෘතියෙන් අනාවරණය කර නොතිබුණි.

(ඒ) පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු කාර්යාලයේ නිලධාරීන් 7 දෙනෙකුගේ සහ කළාප කාර්යාල පහක නිලධාරීන් 188 දෙනෙකුගේ එකතුව රු.8,235,113 ක් වූ ණය ශේෂ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පළාත් රාජ්‍ය නිලධාරීන්ට අත්තකාරම් ගිණුමේ අනාවරණය කර නොතිබුණි.

(ඔ) බදුල්ල කලාප අධ්‍යාපන කාර්යාලයේ නිලධාරීන් දෙදෙනෙකු හා වැලිමඩ කලාප අධ්‍යාපන කාර්යාලයේ නිලධාරීන් 04 දෙනෙකු විසින් භාර ගැනීම ප්‍රතික්ෂේප කරන ලද එකතුව රු. 469,500 ක ණය මුදල් සමාලෝචිත වර්ෂයේ දුන් ණය ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඕ) 2011 දෙසැම්බර් 31 දිනට නිරවුල කර තිබුණ බණ්ඩාරවෙල කලාප අධ්‍යාපන කාර්යාලයේ නිලධාරීන් 23 දෙනෙකුගේ එකතුව රු. 568,762 ක් වූ ණය ශේෂ සහ වැලිමඩ කලාප අධ්‍යාපන කාර්යාලයේ නිලධාරීන් 02 දෙනෙකුගේ එකතුව රු. 67,650 ක වූ ණය ශේෂ තවදුරටත් නිරවුල් නොවූ ණය ලෙස ගිණුම්වල දක්වා තිබුණි.

(ක) ඔක්කම්පිටිය බීජ ගොවිපල් අත්තිකාරම් ගිණුමේ එකතුව රු. 3,754,798 ක් වූ වැඩියෙන් දැක්වීම් 09 ක්ද, එකතුව රු.1,200,308 ක් වූ අඩුවෙන් දැක්වීම් 06 ක්ද විය.

(ග) බොරලන්ද සත්ව ගොවිපලේ වාණිජ අත්තිකාරම් ගිණුමේ,

(i) රු.2,835,447 ක් වූ වැටුප්, වියදම් සාරාංශය අනුව රු. 2,570,798 ක් වීමෙන් වැටුප් වියදම රු.264,469 ක් වැඩියෙන් සටහන් කර තිබුණි.

(ii) වෙනම වත්කමක් ලෙස හෙළිදරව් කළයුතු 2011 දෙසැම්බර් 31 දිනට සත්ව ශේෂය රු.2,731,190 ක් සාමාන්‍ය තොග අයිතමයක් ලෙස දක්වා තිබුණි.

(iii) වර්ෂය තුළදී සත්ව ශේෂයේ රු. 26,100 කන් (කි.ග්‍රෑ. 226) වැඩි වීම ගිණුමේ හෙළිදරව් කර නොතිබුණි.

(iv) 2010 වර්ෂය අවසානයේ වටිනාකම රු. 2,756,450 හා කි. ග්‍රෑ. 27,564ක් වූ සත්ව ශේෂයක් 2011 ජනවාරි 01 දිනට රු. 2,756,450 හා කි. ග්‍රෑ. 23,598 ක් ලෙස දැක්වීම හේතුවෙන් කි.ග්‍රෑ. 3,867 ක් තොග ශේෂය අඩුවෙන් දක්වා තිබුණි.

(v) භෞතිකව නොපවතින රු. 211,821 ක්වූ පොලිතන් ගෘහය ශේෂ පත්‍රයේ වත්කමක් ලෙස දක්වා තිබුණි.

(vi) 2011 ජුලි 29 දිනැති අංක යූවී/බීඩී/සී/2011/26 දරණ විගණන විමසුමෙන් පෙන්වා දී ඇති 2006 වර්ෂයට පෙර ගලවා ඉවත් කරන ලද රු. 324,290 ක් වටිනා ක්ෂුද්‍ර ජල පද්ධතිය පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(vii) 2011 දෙසැම්බර් 31 දිනට තොග අගය කිරීමේදී ගොවිපල තුළ පවතින තෘණ දඩු වගාව අගය කර නොතිබුණි. තෘණ වගාව සඳහා වෙනම නිෂ්පාදන ගිණුමක් පළයෙල කර නොතිබුණි.

(ඝ) ආයුර්වේද දෙපාර්තමේන්තුවේ කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ දැක්වෙන සේවයේ නියුතු නිලධාරීන්ගේ ණය ශේෂය රු.314,202 කින්ද, ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ රු.1,300 කින්ද, ස්ථාන මාරු වීම් ලබා පැමිණි නිලධාරීන්ගේ ණය ශේෂ රු.310,913කින්ද, ගිණුමට අමුණා ඇති එකී උපලේඛනවල එකතු සමඟ නොසැසඳුණි.

## 1.3.3 **නොසැසඳූ පාලන ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2011 දෙසැම්බර් 31 දිනට ඌව පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශනයේ දැක්වෙන පළාත් රාජ්‍ය නිලධාරින්ට ණය හා අත්තිකාරම් ගිණුම්වල ශේෂ සහ එක් එක් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු /කාර්යාල 08ක විසර්ජන ගිණුම් සමඟ වූ සටහන (ii) අත්තිකාරම් ගිණුම් සහ තැන්පත් ගිණුම් සඳහා වූ පාලන ගිණුම්වල සාරාංශ වාර්තාවේ ඇතුළත් එදිනට අනුරූපී ශේෂවල එකතුව රු. 7,995,655 කින් වෙනස් වී තිබුණි.

(ආ) 2011 දෙසැම්බර් 31 දිනට මුල්‍ය කළමනාකරණ දෙපාර්තමේන්තුවේ පොත්වල දැක්වෙන පළාත් රාජ්‍ය නිලධාරීන්ට ණය හා අත්තිකාරම් ගිණුම් 09 ක සහ එක් එක් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු / කාර්යාල විසින් ඉදිරිපත් කළ විසර්ජන ගිණුම් සමඟ වූ සටහන (ii) අත්තිකාරම් ගිණුම් සහ තැන්පත් ගිණුම් සඳහා වූ පාලන ගිණුම්වල සාරාංශ වාර්තාවේ ඇතුළත් අනුරූපී ශේෂ අතර එකතුව රු. 6,173,541 කින් වෙනස් වී තිබුණි.

(ඇ) 2011 දෙසැම්බර් 31 දිනට පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන නොපියවූ අග්‍රිම ශේෂවල එකතුව හා එක් එක් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු / කාර්යාල විසින් ඉදිරිපත් කළ විසර්ජන ගිණුම් සමඟ වූ සටහන (iii) අග්‍රිම ගිණුම් පිළිබඳ සාරාංශ වාර්තාවේ ඇතුළත් එදිනට අනුරූපී හර ශේෂයන් 11ක එකතුව රු.55,412,522 කින් ද, බැර ශේෂයන් 05ක එකතුව රු.1,170,861 කින්ද වෙනස් වී තිබුණි.

(ඈ) පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පළාත් රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් පාලන ගිණුමේ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.301,540,397 ක් වූ අතර කේවල ශේෂ ලේඛනයේ එකතුව රු.304,982,452 ක් විය.

### 1.3.4 **නොසැසඳීම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) කාර්යාලයේ මුදල් රෙගුලාසි 427 හි විධිවිධාන ප්‍රකාරව පොදු තැන්පත් ගිණුම් ශේෂ මූල්‍ය කළමනාකරණ දෙපාර්තමේන්තුවේ පොත් සමඟ සසඳා නොතිබීම නිසා දෙපාර්තමේන්තු පොත් අනුව ආරම්භක ශේෂය හා අවසාන ශේෂය පළාත් සභා මූල්‍ය ප්‍රකාශයේ අනුරූප සංඛ්‍යා සමඟ රු.8,383,617 කින් වෙනස් විය.

(ආ) මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ පොදු තැන්පතු ගිණුමේ 2011 දෙසැම්බර් 31 දිනට රු.28,939,664 ක්වූ අවසාන ශේෂය පළාත් සභා මූල්‍ය කළමනාකරණ දෙපාර්තමේන්තුවේ පොත් අනුව රු.77,274,714 ක් වීමෙන් රු.48,335,050 ක වෙනසක් විය.

### 1.3.5 **බැංකු සැසඳුම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඌව පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය රාජ්‍ය බැංකුවක පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුම රු. 42,702ක මුදලක් සමඟ වර්ෂ හතකට වැඩි කාලයක් අක්‍රියව පවතී.

(ආ) බැංකු ගිණුම් 14 ක තැන්පත් කර මාස 06 ක කාලයක් ඉක්මවී තිබුණ උපලබ්ධි නොවූ එකතුව රු. 40,962,149 ක්වූ චෙක්පත් 206 ක් සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු කර නොතිබුණි.

(ඇ) බැංකු ගිණුම් 17 ක නිකුත් කළ නමුත් මාස 06 ඉක්මවා ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ එකතුව රු. 6,446,807 ක් වූ චෙක්පත් 690 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඈ) ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

(ඈ) බැංකු ගිණුම් 07 කට අදාල හඳුනා නොගත් හර රු. 2,228,122 ක් වූ අතර, බැංකු ගිණුම් 06 කට අදාල හඳුනා නොගත් බැර රු. 4,105,591 ක් විය.

### 1.3.6 අග්‍රිම ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2011 දෙසැම්බර් 31 දිනට ශීර්ෂ 25කට අදාලව එකතුව රු.167,575,066 ක් වූ නිරවුල් නොකල අග්‍රිම හර ශේෂ 35 ක්ද, ශීර්ෂ 08කට අදාලව රු. 9,711,072 ක් වූ බැර ශේෂ 12 ක් ද තිබුණි.

(ආ) ඌව පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශය අනුව 2011 දෙසැම්බර් 31 දිනට රු.4,349,991 ක් වූ අග්‍රිම ගිණුමේ ශේෂය සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම සමඟ ඉදිරිපත් කර තිබුන සටහන (ii) අග්‍රීම ගිණුම් පිළිබඳ වාර්තාවේ ශුන්‍ය අගයක් ලෙස දක්වා තිබුණි.

### 1.3.7 පොදු තැන්පත් ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 571 හි විධිවිධාන පරිදි කටයුතු කළ හැකිව තිබුණු නමුත් එසේ කටයුතු නොකළ 2011 දෙසැම්බර් 31 දිනට වර්ෂ 2 කට වැඩි කාලයක් ඉක්මවා තිබුණ කාර්යාල 17 ක තැන්පත් ශේෂ 454 ක එකතුව රු. 48,699,778 ක් විය.

(ආ) ඌව පළාත් සභා ලේකම් කාර්යාලයේ සභා ගර්භය සඳහා අළුතින් ත්‍රිභාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ශබ්ධවාහිනි පද්ධතියක් සවිකිරීමට පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය විසින් 2011 නොවැම්බර් 14 දිනැති ලිපිය මගින් ලබාදී තිබුණ රු. 1,000,000 ක්, එම වැඩසටහන ක්‍රියාත්මක නොකිරීම නිසා 2012 අප්‍රේල් 27 වන විගණන දින දක්වාම නිෂ්කාර්යව පොදු තැන්පත් ගිණුමෙහි රඳවා ගෙන තිබුණි.

(ඇ) 2009 අවිච්ඡේද ව්‍යාපෘති සඳහා 2010 දී ප්‍රධාන ලේකම් වෙතින් ලැබී තිබුණ රු. 14,005,961 කින් රු. 4,508,739 ක්ද, යෞවන නර්ථන කණ්ඩායම් කළ එළි මංගල්‍යය සඳහා ලැබී තිබුණ සමරු කලාප ආදායම් රු. 37,500 ක්ද, 2011 දෙසැම්බර් 31 දින වන විටත් ඌව පළාත්

ප්‍රධාන අමාත්‍ය, මුදල්,ක්‍රමසම්පාදන, නීතිය හා සාමය පළාත් පාලන, අධ්‍යාපන, ප්‍රවාහන, සංස්කෘතික කටයුතු, ඉඩම්, වාරිමාර්ග,ආර්ථික ප්‍රවර්ධන, ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ පොදු තැන්පත් ගිණුමේ විය

(ඇ) බිබිල කලාප අධ්‍යාපන කාර්යාලයට ලබාදී තිබුණු එකතුව රු. 725,000 ක්වූ ශිෂ්‍යාධාර ප්‍රතිලාභී ශිෂ්‍යයින් වෙත ලබා නොදී වසර 1-3 අතර කාලයක සිට පොදු තැන්පතු ගිණුමේ රඳවාගෙන තිබුණි.

### 1.3.8 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් නිරක්ෂණයන් කරනු ලැබේ.

(අ) <u>පිළිතුරු නොලත් විගණන විමසුම්</u>

2011 දෙසැම්බර් 31 දින වනවිට විගණන විමසුම් 22 කට පිළිතුරු සපයා නොතිබූ අතර, එකී විමසුම්වලට භාජනය වූ ගණනය කල හැකි ගනුදෙනුවල වටිනාකම රු. 168,064,289 ක් විය.

(ආ) <u>තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම</u>

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.56,545,090 ක් වූ ගනුදෙනු 442 ක් විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරික්ෂණය කිරීමට නොහැකි විය.

### 1.3.9 අනුකූල නොවීම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ .

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව. | අනුකූල නොවීම |
|---|---|
| (i) **ව්‍යවස්ථාපිත විධිවිධාන** | |
| 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත | ඌව පළාත් පුස්තකාල සේවා මණ්ඩලයේ තාවකාලික පදනම මත සේවයේ නියුතු නිළධාරින් 03 දෙනෙකුගෙන් 2010 ජනවාරි සිට 2011 සැප්තැම්බර් දක්වා සේවක වැටුපෙන් අය කළ යුතු සියයට 8 ක දායක මුදල වන රු. 29,244 ක් වැටුපෙන් අඩුකරගෙන නොතිබුණු අතර සියයට 12 ක් වූ ආයතනයේ දායකය රු.43,866 ක්ද සමඟ ගෙවිය යුතු රු. 73,110 ක් සේවක අර්ථ සාධක අරමුදලට ගෙවා නොතිබුණි. |

| | |
|---|---|
| 1980 අංක 46 දරන සේවා නයුක්තයින්ගේ භාර අර මුදල් පනත | ඌව පළාත් පුස්තකාල සේවා මණ්ඩලයේ තාවකාලික පදනම මත සේවයේ නියුතු නිලධාරීන් 03 දෙනෙකු වෙනුවෙන් 2010 ජනවාරි සිට 2011 සැප්තැම්බර් දක්වා සේවා නියුක්ති භාර අරමුදලට ගෙවිය යුතු සියයට 3 ක්වූ දායක මුදල් රු. 10,966 ක් ගෙවා නොතිබුණි. |
| 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ අංක 33(1) වගන්තිය | සර්වේ ජනරාල්ගේ අංක B/BDL/2009/174 සහ 2010 ජුනි 15 දිනැති අනුරේඛනයෙහි කැබලි අංක "ඒ" වශයෙන් දැක්වෙන හෙක්ටයාර් 1.0118 වපසරියකින් යුත් මගුල් ලියද්ද නැමති ඉඩමේ භුක්තිය 1950 අංක 09 දරන ඉඩම් අත්පත් කරගැනීමේ පනතේ 38 (අ) අතුරු විධානය අනුව 2011 අගෝස්තු 08 දින 2011 පෙබරවාරි 14 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනයෙන් බදුල්ල ප්‍රාදේශීය ලේකම් විසින් බ/විහාරමහදේවි බාලිකා මහා විදුහලට බාරදී තිබුණ ඉඩමේ වටිනාකම ප්‍රධාන තක්සේරුකරු වෙතින් ලබාගෙන නොතිබුණි. 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ අංක 33(1) වගන්තිය ප්‍රකාර ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්වරයාගේ ලිඛිත අවසරයද ලබාගෙන නොතිබුණි. |
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තියේ (viii) උප වගන්තිය අනුව සාදන ලද අතුරු ව්‍යවස්ථා | ඔහිය ක්ෂේත්‍ර පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීමේ ගොඩනැගිලි සැලැස්ම 1988අගෝස්තු 23 දින අංක 520/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද ප්‍රාදේශීය සභා අතුරු ව්‍යවස්ථා 08 කොටසේ දැක්වෙන නියමයන්ට අනුකූලවන බවට වැලිමඩ ප්‍රාදේශීය සභාවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| 1951 අංක 14 දරන මෝටර් රථ වාහන පනතේ VI වන පරිච්ඡේදයේ | 2011 පෙබරවාරි 18 දින දිසා යාන්ත්‍රික කාර්යාලයට මිළදී ගන්නා ලද එක්ස්කැවේටරයක් සහ බැකෝ යන්ත්‍රයක් සඳහා ලියාපදිංචි සහතිකය සහ රක්ෂණ ආවරණ ලබාගෙන නොතිබුණි. |
| ඌව පළාත් අධ්‍යාපන ප්‍රඥප්තියේ 10(VI) උප වගන්තිය | අධ්‍යාපන උපදේශක මණ්ඩලයේ උපදෙස් ලබානොගෙන වැල්ලවාය කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් මො/මීදෙණිය ප්‍රාථමික විදුහල 2010 නොවැම්බර් 01 දින සිට වසා දමා තිබුණි. |

(ii) **ආයතන සංග්‍රහය**

------------------

| | |
|---|---|
| XXIV පරිච්ඡේදයේ 3.5 වගන්තිය | පළාත් සභාවේ අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු/කාර්යාලය 07 ක් විසින් සියයට 40 අවකරණ සීමාව ඉක්මවා නිලධාරීන් 25 කට රු.1,061,612 ක ආපදා ණය ලබාදී තිබුණි. |

(iii) **මුදල් රෙගුලාසි**

----------------

| | |
|---|---|
| මුදල් රෙගුලාසි 65(4)(i) හා ඌව පළාත් සභා මුදල් රීති සංග්‍රහයේ | වැය විෂය අංක 736-8-3-1905 (වෙනත්) යටතේ වෙන්කර තිබුණ මුළු පුනරාවර්තන ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 93.18 ක්වූ රු.174,086,000 |

| | |
|---|---|
| 65(4)(i) | කින් දැරිය හැකි වියදම් පිළිබඳ වර්ගීකරණයක් වාර්ෂික මුදල් ප්‍රකාශයේ ඉදිරිපත් කර නොතිබුණු අතර එම වැය විෂය යටතේ වෙන්කර තිබුණ ප්‍රතිපාදනවලින් ශීර්ෂ අංක 701 සහා ලේකම් කාර්යාලය සඳහා රු. 3,284,800 ක්ද, ශීර්ෂ අංක 705 ක්‍රීඩා අමාත්‍යාංශය සඳහා රු. 3,684,500 ක්ද වන පරිදි එකතුව රු. 6,661,000 ක් එම වැය ශීර්ෂවල පුනරාවර්තන වියදම් වෙනුවෙන් ලබාදී තිබුණි. |
| 511.1 | ඌව පළාත් මුද්‍රණාල අත්තිකාරම් ගිණුමේ රු.2,217,738ක් ද, කළාත්මක පේෂ කර්මාන්ත අත්තිකාරම් ගිණුමේ රු.119,583 ක්ද, පේෂ කර්මාන්ත අත්තිකාරම් ගිණුමේ රු.1,955,059 ක්ද,වූ කාරක පාඩු පියවීමට ප්‍රතිපාදන සලසා ගෙන නොතිබුණි. |
| 880 | ඌව පළාත් පුස්තකාල සේවා මණ්ඩලයට අයත් නිලධාරීන් ගෙන්, සහ බිබිල කලාප අධ්‍යාපන කාර්යාලයේ ඇප තැබිය යුතු නිලධාරීන් දෙදෙනෙකුගෙන් ඇප තැන්පත් ලබාගෙන නොතිබුණි. |

(iv) **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

---------------------------

| | |
|---|---|
| 1996 මාර්තු 15 දිනැති 1996/08 අංක දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | අවශ්‍ය ඇපකර ලබා නොගෙන සේවා කාලය අවුරුදු 10 ට අඩු පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් දෙදෙනෙකුට රු. 328,800 ක ආපදා ණය ලබාදී තිබුණි. |

(v) **වෙනත් චක්‍රලේඛ**

-----------------

| | |
|---|---|
| 2007 ජනවාරි 04 දිනැති 01/2007 අංක දරන විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ හා වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂකගේ චක්‍රලේඛයේ 2:2 ඡේදය | වැල්ලවාය කලාප අධ්‍යාපන කාර්යාලය විසින් 2005, 2006 වර්ෂ සඳහා පළාත් රාජ්‍ය නිලධාරීන් ගෙන් අයකරගත් දායක මුදල් රු.19,934,603 ක් ද, බණ්ඩාරවෙල කලාප අධ්‍යාපන කාර්යාලය විසින් 2004 සිට 2007 දක්වා දායකත්ව විශ්‍රාම වැටුප් සඳහා අයකරගත් දායක මුදල් රු. 866,055 ක් ද වන එකතුව රු. 20,800,658 ක් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය නොකර 2011 දෙසැම්බර් 11 වන විටත් පොදු තැන්පතු ගිණුමේ රඳවාගෙන තිබුණි. |
| 2008 මාර්තු 05 දිනැති DMS/C/01/PAHA/15 අංක දරන කළමනාකරණ සේවා අධ්‍යක්ෂක ජනරාල්ගේ ලිපිය | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 9/2007 යටතේ විශ්‍රාමික රජයේ නිලධාරීන් නැවත සේවය පිහිටුවන ලද නිලධාරීන්ට නිවාඩු දින වැටුප් ගෙවීමේදී ඔවුන් සේවයේ යොදවා ඇති තනතුරේ ආරම්භක වැටුප පදනම් කර නොගෙන නිවාඩු දින 75 ක් සඳහා රු. 60,496 ක් සමුපකාර කොමසාරිස්වරයාට නිවාඩු දින |

| | |
|---|---|
| | වැටුප ගෙවා තිබුණි. |
| 2/2008 අංක දරන ඌව පළාත් ප්‍රධාන ලේකම්ගේ අභ්‍යන්තර චක්‍රලේඛයේ 07 ඡේදය | දෙපාර්තමේන්තුව විසින් වාහන 02 ක ධාවනය වන සැතපුම් ගණන හා දැවෙන ඉන්ධන ප්‍රමාණය පරීක්ෂාවට ලක්කර නොතිබුණි. |
| 2011 සැප්තැම්බර් 12 දිනැති 9/සං/4 අංක දරන ප්‍රධාන අමාත්‍යාංශයේ ගණකාධිකාරීගේ ලිපිය | ඌව පළාත් පුස්තකාල සේවා මණ්ඩලය විසින් පුස්තකාල ශ්‍රවණාගාරය වෙන්කරීමේදී අවස්ථා 02 දී අයකරගත යුතුව තිබුණ රු.23,000 ක්වූ සියයට 50 ක අත්තිකාරම් මුදල් අයකරගෙන නොතිබුණි. |
| 2009 අප්‍රේල් 07 දිනැති 10/4/1 අංක දරන සහ 2009 ජුලි 08 දිනැති ඌව පළාත් ප්‍රධාන ලේකම්ගේ ලිපි | ඔහිය ක්ෂේත්‍ර පුහුණු මධ්‍යස්ථානය ඉදිකරනු ලබන භූමිය පිළිබඳ කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂාවේදි එම භූමිය සංචාරක නිවාසයක් සඳහා ඉතා සුදුසු බවට කර තිබුණ නිර්දේශයට පටහැනිව එම භූමිය තුළ නිලධාරීන්ට පුහුණු මධ්‍යස්ථානයක් ඉදිකරමින් තිබුණි. |

(vi) **අධ්‍යාපන අමාත්‍යාංශයේ චක්‍රලේඛ**

| | |
|---|---|
| (අ) අධ්‍යාපන අමාත්‍යාංශයේ 2004 අප්‍රේල් 21 දිනැ ති අංක 2000/36(1) දරන චක්‍රලේඛය | වැල්ලවාය අධ්‍යාපන කලාපයේ පළාත් සභා පාසල් 02 ක රු. 40,966 ක දුරකථන බිල්පත් වැල්ලවාය කලාප කාර්යාලය විසින් ගෙවා තිබුණි. |

(ආ) පාසල් සංවර්ධන සමිති කටයුතු මෙහෙයවීම සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් නිකුත් කරනු ලැබූ 1982 මාර්තු 30 දිනැති අංක 1982/2, 1985 ඔක්තෝබර් 21 දිනැති අංක 4/මු/06/213, 2001 ඔක්තෝබර් 08 දැනැති අංක 2001/24 හා 2008 සැප්තැම්බර් 15 දිනැති අංක 35/2008 දරන චක්‍රලේඛවල සඳහන් වැදගත් ප්‍රතිපාදනයන් බදුල්ල දිස්ත්‍රික්කයේ පාසල් 02 ක් විසින් අනුගමනය කර නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය. අනුකූල නොවූ අවස්ථාවන් පහත පරිදි විය.

* පාසල් සංවර්ධන සමිති රැස්වීම් පවත්වා නොතිබීම.
* සාමාජික නාම ලේඛන හා ලදුපත් පවත්වා නොගැනීම.
* වාර්ෂික ගිණුම් පරීක්ෂණ කටයුතු සඳහා නිලධාරීන් පත්කර නොතිබීම.
* වාර්ෂික අයවැය පිළියෙල කර නොතිබීම.
* ගිණුම් වලින් අවිධිමත් ලෙස මුදල් ගැනීම.
* නවක සිසුන් බඳවා ගැනීමේදී මුදල් ලබාගැනීම.

---

(vii) **බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම**

පහත සඳහන්නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත් කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සත්ව නිෂ්පාදන, මිරිදිය ධීවර කර්මාන්ත,පරිසර සහ සංචාරක කටයුතු අමාත්‍යාංශයේ නිලධාරියෙකුගෙන් රු.42,856 ක්ද, පළාත් මාර්ග සංවර්ධන,නිවාස, ජල සම්පාදන, පාරිභෝගික කටයුතු හා සමුපකාර සහ ආහාර සැපයීම් හා බෙදාහැරීම් අමාත්‍යාංශයේ නිලධාරියෙකුගෙන් රු. 88,188 ක්ද උපයන විට ආදායම් බදු සඳහා අයකරගෙන තිබුණද දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

(ආ) 2007 අංක 14 දරණ එකතු කළ අගය මත බදු සංශෝධිත පනතේ 26 "අ" වගන්තියට අනුව දියතලාව මූලික රෝහලේ දැඩි සත්කාර ඒකකය සඳහා මධ්‍යගත වායු සමීකරණ පද්ධතියක් සපයා දීම වෙනුවෙන් 2009 මාර්තු 18 දින ලංකා විදුලි බලමංඩලයට රු.6,077,029 ක් ගෙවීමේදී ගෙවන ලද එකතු කළ අගය මත බදු මුදල වන රු.911,554 කින් රු.303,851 ක මුදලක් අයකර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

(ඇ) දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාගේ අංක SD/INF/2010/03 හා 2010 සැප්තැම්බර් 30 දිනැති මුද්දර බදු අයකිරීම පිළිබඳ චක්‍රලේඛයේ 1 ඡේදය ප්‍රකාර 2008 වර්ෂයේ සිට නිකුත් කරනු ලැබූ මත්පැන් විකිණීමේ බලපත්‍ර සඳහා මුද්දර බදු හා එසේ අයනොකළ බලපත්‍ර සඳහා 2011 වර්ෂයේ බලපත්‍ර නිකුත් කිරීමේදී හිඟ මුදල්ද සමඟ මුද්දර බදු රු. 1,100,000 හාලිඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ද, රු.1,840,000 ක් දී බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අයකර නොතිබුණි.

(ඈ) 1996 අගෝස්තු 01 දනැති ඉඩම් අංක 96/09 දරන කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති චක්‍රලේඛයට අනුව පුද්ගලයන් 07 දෙනෙකුගෙන් අයකළ යුතු බදු හා දඩ මුදල් රු. 3,062 ක් පස්සර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අයකරගෙන නොතිබුණි.

(ඉ) සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විසින් ලෝක බැංකු ආධාර යටතේ ලැබී තිබුන විදේශ අරමුදල් වලින් රු.293,514 ක් දේශීය ආදායම් බදු හා එකතු කළ අගයමත බදු ගෙවීම සඳහා යොදා ගෙන තිබුණි.

(ඊ) අධ්‍යාපන අංශ සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ලැබී තිබුන ප්‍රදානවලින් රු. 3,131,936 ක් අවස්ථා 16 කදී එකතුකළ අගය මත බදු වශයෙන්ද රු. 100,827 ක් අවස්ථා 07 ක දී රඳවාගැනීමේ බදු වශයෙන්ද ගෙවා තිබුණි.

2. **මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

---

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ රු.8,289,893,535 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 7,966,721,900 ක් විය. මේ අනුව 2011 දෙසැම්බර් 31 දිනට ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.323,171,635 කින් වැඩිවී තිබුණි.

## 2.2 ආදායම් හා වියදම්

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලොචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් හා විචලනය පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

ආදායම

| | 2011 | | | 2010 | | |
|---|---|---|---|---|---|---|
| | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **පළාත් සභා විෂයන්ට අදාල ආදායම්** | | | | | | |
| බදු ආදායම් | 827,326,000 | 1,503,998,803 | 676,672,803 | 885,925,000 | 888,455,480 | 2,530,480 |
| බදු නොවන ආදායම් | 408,674,000 | 303,608,456 | (105,065,544) | 204,075,000 | 225,031,695 | 20,956,695 |
| රජයේ ප්‍රදාන | 10,347,000,000 | 10,404,988,682 | 57,988,682 | 9,032,235,000 | 8,300,000,000 | (732,235,000) |
| | 11,583,000,000 | 12,212,595,941 | 629,595,941 | 10,122,235,000 | 9,413,487,175 | (708,747,825) |

වියදම

| | 2011 | | | 2010 | | |
|---|---|---|---|---|---|---|
| | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **පුනරාවර්තන වියදම** | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 8,380,903,944 | 8,271,032,237 | 109,871,707 | 7,701,088,542 | 7,619,882,677 | 81,205,865 |
| අනෙකුත් | 2,462,730,607 | 1,826,468,557 | 636,262,050 | 2,556,949,000 | 1,460,326,399 | 1,096,622,601 |
| උප එකතුව | 10,843,634,551 | 10,097,500,794 | 746,133,757 | 10,258,037,452 | 9,080,209,076 | 1,177,828,466 |
| ප්‍රාග්ධන වියදම් | 3,627,634,865 | 1,613,713,379 | 2,013,921,486 | 4,815,615,000 | 2,175,338,519 | 2,640,276,481 |
| | 14,471,269,416 | 11,711,214,173 | 2,760,055,243 | 15,073,652,542 | 11,255,547,595 | 3,818,104,947 |

සමාලෝචිත වර්ෂය සඳහා මුළු වියදම රු.11,711,214,173 ක් විය. ඉන් සියයට 86.2 ක් පුනරාවර්තන වියදම් වූ අතර සියයට 13.8 ක් මූලධන වියදම් විය.

## 2.3 ආදායම් පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඌව පළාත් මුදල් රීති සංග්‍රහයේ නියෝග අංක 151.1 ප්‍රකාරව ඇස්තමේන්තුගත ආදායම, තත්‍ය ආදායම සමඟ ආදායම් අතිරික්තයට හෝ ඌනතාවයට හේතු දක්වා නොතිබුණි.

(ආ) 2011 මුදල් ප්‍රකාශයේ දැක්වෙන ඇස්තමේන්තුගත බදු ආදායම හා බදු නොවන ආදායම, තථ්‍ය බදු ආදායම හා බදු නොවන ආදායම අතර රු. 571,607,620 ක වාසිදායක විචලතාවයක් වීමෙන් ආදායම් ඇස්තමේන්තු සකස් කිරීම සඳහා යොදාගත් තොරතුරු ප්‍රමාණවත්, විශ්වාසවන්ත, යාවත්කාලීන හා වඩාත් නිවැරදි ඒවා බවට විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය.

(ඇ) ඌව පළාත් සභාවේ සමාලෝචිත වර්ෂයේදී ආදායම් විෂයයන් 18 ක ඇස්තමේන්තුගත ප්‍රමාණය හා තත්‍ය වශයෙන් රැස්කළ ප්‍රමාණය අතර සියයට 53 සිට සියයට 1424 දක්වා විචලතාවයන් විය.

(ඈ) ඌව පළාත් සභාවේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 13 ක් විසින් සමාලෝචිත වර්ෂයේදී ඇස්තමේන්තුගත ආදායම් සහ රැස්කළ ආදායම් ප්‍රමාණය සියයට 66 සිට සියයට 819 දක්වා විචලතාවයන් විය.

## 2.4 ප්‍රතිපාදන කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ශීර්ෂ 20 ක වැය විෂයයන් 96 ක් යටතේ වූ රු. 7,666,000 ක ශුද්ධ ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරි කර තිබුණි.

(ආ) ශීර්ෂ අංක 703 ඌව පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් වැය විෂයයන් 03 ක් සඳහා ඉල්ලීම් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණයට වඩා වැඩිපුර ලබාදෙන ලද එකතුව රු.330,000 ක්වූ ප්‍රතිපාදන ප්‍රයෝජනයට නොගෙන ඉතිරි කර තිබුණි.

(ඇ) බණ්ඩාරවෙල අධ්‍යාපන කලාපයේ පාසල් 123 ක් විසින් 2010 දෙසැම්බර් 31 දිනට රු.14,449,514 ක් ද, වැල්ලවාය අධ්‍යාපන කලාපයේ පාසල් 84 ක් විසින් 2011 දෙසැම්බර් 31 දිනට රු. 20,193,636 ක් ද ගුණාත්මක යෙදවුම් මුදල්, වියදම් නොකර ඉතිරිකර තිබුණි.

(ඇ) පැරණි වාහන අළුත්වැඩියා කිරීම සඳහා නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලයෙන් 2011 නොවැම්බර් 29 දින ලැබුණු රු. 1,565,859 ක මුදලෙන් රු. 1,105,286 ක මුදලක් වියදම් නොකර ආපසු යවා තිබීමෙන් ලබාදී තිබූ මුදලින් අදාල කාර්යය නියමිත පරිදි ඉටුකර තිබූ බවට පිළිගත නොහැකි විය.

(ඉ) මුදල් රෙගුලාසි 94(1) ට පටහැනිව අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ශීර්ෂ 10 ක වැය විෂයයන් 45 ක් යටතේ රු. 29,561,197 ක ප්‍රතිපාදන ඉක්මවා බැරකම් වලට බැඳී තිබුණි.

## 2.5 අනුමත ප්‍රතිපාදන ඉක්මවා වියදම් දැරීම්

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 69 නියමයට හා ඌව පළාත් සභා මුදල් රීති 32 හි දැක්වෙන නියමයන්ට පටහැනිව යෞවන කටයුතු, ක්‍රීඩා, සමාජ සුභසාධන, වතු යටිතලපහසුකම් සංවර්ධන, විදුලිබල හා බලශක්ති සහ පේෂ කර්මානත, කුඩා කර්මාන්ත අමාත්‍යාංශය විසින් වැය විෂයයන් 17 ක් සඳහා රු.2,927,520 ක වියදමක් දරා තිබුණි.

## 2.6 අත්තිකාරම් ගිණුම්වල සීමාවන් නොපිළිපැදීම්

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 503 හා ඌව පළාත් සභා මුදල් රීති 369 හි නියමයන්ට පටහැනිව අත්තිකාරම් ගිණුම් විෂයයන් 06 ක වියදමෙහි උපරිම සීමාව රු.17,221,798 කින් ද, විෂයයන් 11 ක හර ශේෂයේ උපරිම සීමාව රු.10,357,250කින් ද ඉක්මවා තිබුන අතර විෂයයන් 04 ක ලැබීම්වල අවම සීමාව රු.13,319,069 කින් පහත වැටී තිබුණි.

## 2.7 කාරක පාඩු

වාණිජ අත්තිකාරම් ගිණුම් 03 ක පසුගිය වර්ෂ 03 කදී දිගින් දිගටම කාරක පාඩු වාර්තා වී තිබුණි. මුදල් රෙගුලාසි 513 විධිවිධාන අනුව යථෝක්ත කාරක පාඩු ආවරණය කර ගැනීම සඳහා කටයුතු කර නොතිබූ අතර, අත්තිකාරම් ගිණුම් පාඩු පිට පවත්වාගෙන යාමේ ආර්ථික හා සමාජ සාධාරණයත්වය පිළිබඳව කළමනාකාරත්වය විසින් අවධානය යොමුකර නොතිබුණි.

## 2.8 මානව සම්පත් කළමනාකරණය

### 2.8.1 අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2011 දෙසැම්බර් 31 දිනට මධ්‍යම පළාත් සභාවේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

(අ) <u>පළාත් සභා, අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු, ආයතනය - පාසැල් කාර්ය මණ්ඩලය හැර</u>

| | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 798 | 743 | 55 | - |
| තෘතියික මට්ටම | 1,396 | 1,036 | 360 | - |
| ද්විතික මට්ටම | 19,619 | 19,979 | - | 360 |
| ප්‍රාථමික මට්ටම | 3,441 | 3,875 | - | 434 |
| වෙනත් (අනියම්, තාවකාලික) | 14 | 1,491 | - | 1,477 |

(ආ) <u>පාසල් කාර්ය මණ්ඩලය</u>

| | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| විදුහල්පති | 1011 | 407 | 604 |
| ගුරුභවතුන් | 16,320 | 15,904 | 416 |
| කණිෂ්ඨ සේවකයින් | 1,250 | 1,224 | 26 |

### 2.8.2 කාර්ය මණ්ඩලය අනුයුක්ත කිරීම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2011 ඔක්තෝබර් 10 දිනැති අංක සීඑස්ඒ/6/6/10/5 දරන ගරු ආණ්ඩුකාරවරුන් අමතා ජනාධිපති ලේකම්වරයා විසින් නිකුත් කර ඇති විශ්‍රාමික රජයේ නිලධාරීන් නැවත පළාත් රාජ්‍ය සේවයේ යෙදවීම පිළිබඳ චක්‍රලේඛයේ 02 වන ඡේදය සහ 2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/30 දරන රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති පිළිබඳ අති විශේෂ ගැසට් නිවේදනයේ 177 වන ඡේදයට පටහැනිව,

(i) ශ්‍රී ලංකා ගණකාධිකාර සේවයේ I වන පන්තියේ විශ්‍රාමික නිලධාරියෙකු 2012 දෙසැම්බර් 31 දින දක්වා වසරක කාලයක් ආයතන 04 ක ගණකාධිකාර තනතුරුවල රාජකාර් කිරීම

(ii) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන පංතියේ විශ්‍රාමික නිලධාරියෙක් ආණ්ඩුකාරවර ලේකම් තනතුරේ රාජකාරි කිරීම සඳහා 2011 ජුනි 10 දින සිට 2012 ජුනි 09 දින දක්වා වසරක කාලයක් සඳහා කොන්තාත් පදනම මත ද, 2011 ජුනි 10 දින සිට ඌව කළමනාකරණ පුහුණු ආයතනයේ අධ්‍යක්ෂ තනතුරේ වැඩබැලීම සඳහාද පත්කර තිබුණි.

(ආ) 2007 වර්ෂයේ සිට 2012 වර්ෂයේ ජුනි 30 දින වන තෙක් වර්ෂ 05 කට අධික කාලයක් දිගින් දිගටම වැටුප් රහිත නිවාඩු ලබා ගෙන ඇති ඔක්කම්පිටිය බීජ ගොවිපලේ සේවකයෙකු සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

## 2.8.3 අවිධිමත් ලෙස වෙනත් පාර්ශවයන්ට නිදහස් කළ මානව සම්පත්

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

(අ) බිබිල කලාපයට අයත් පාසල් 03 කට 2010 ජුලි 01 දින සිට පත්වීම් ලබූ පාසල් කම්කරුවකු හා පාසල් පුස්තකාල සේවකයින් දෙදෙනෙකු එම මාසය තුළදීම ඌව පළාත් ප්‍රධාන අමාත්‍ය කාර්යාලයට අනුයුක්ත කර 2011 නොවැම්බර් මස දක්වා ඔවුන් තිදෙනාට වැටුප් හා දීමනා ලෙස පළාත් අධ්‍යාපන දෙපාරතමේන්තුව විසින් රු. 879,260 ක් ගෙවා තිබුණි.

(ආ) මො/කුඩාඔය විද්‍යාලයේ පුස්තකාල සේවකයෙක් 2011 ඔක්තෝබර් 03 දින සිට ඌව පළාත් ප්‍රධාන අමාත්‍ය මාධ්‍ය ඒකකයට හා මො/වැ/හම්බේගමුව මහා විද්‍යාලයේ සේවය කළ පුස්තකාල සේවකයෙකු 2010 අගෝස්තු 05 දින සිට ඌව පළාත් ප්‍රධාන අමාත්‍ය කාර්යාලයට අනුයුක්ත කර තිබු අතර ඔවුන් අනුයුක්ත කළ දින සිට 2011 නොවැම්බර් දක්වා කලාප කාර්යාලයේ හෝ අදාල පාසල්වල සේවයකර නොතිබියදී එකතුව රු. 298,962 ක් වැටුප් හා දීමනා වශයෙන් කලාප කාර්යාලයෙන් ගෙවා තිබුණි.

(ඇ) මො/ගොඩිගමුව මහා විදුහලේ සේවයේ නියුතු විදුහල්පති ශ්‍රේණියේ 2-II පන්තියේ නිලධාරියකු 2010 ජුනි 03 දින බිබිල කලාප අධ්‍යාපන කාර්යාලයට අනුයුක්ත කර තිබු අතර එතැන් සිට 2011 ඔක්තෝබර් දක්වා කිසිදු රාජකාරි පැවරීමක් හෝ රාජකාරි ඉටුකිරීමක් නොමැතිව වැටුප් හා දීමනා ලෙස රු. 559,087 ක් ගෙවා තිබුණි. ඔහු කලාප අධ්‍යාපන කාර්යාලයට අනුයුක්ත කිරීමේදී ඔහු යටතේ පැවති රජය සතු බඩු බාහිරාදිය විධිමත් පරිදි පාසලට භාරදී නොතිබුණි.

2.8.4 බඳවා ගැනීමේ පරිපාටි වලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

(අ) පළාත් සභා මුදල් රීති සංග්‍රහයේ අංක 71.1 දරන මුදල් රීතිය ප්‍රකාර තනතුරු ඇතිකිරීම වැටුප් පරිමාණ වේතන හා දීමනා ඇති කිරීම ආදිය සඳහා ප්‍රධාන ලේකම් වරයාගේ පූර්ව අනුමැතිය ලබා නොගෙන ඌව පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් 2012 ජනවාරි 11 වන විට ස්ථිර සේවකයන් 108 ක්ද කොන්ත්‍රාත් පදනම මත සේවකයන් 14 කද දෛනික වැටුප් ලබන සේවකයන් 04 ක්ද බඳවාගෙන තිබුණි. ඒ සඳහා අනුමත කාර්ය මණ්ඩලයක්, අනුමත බඳවාගැනීමේ පරිපාටියක් සහ අනුමත වැටුප් පරිමාණයන්ද නොවීය.

(ආ) ඌව පළාත් මගී ප්‍රවාහන අධිකාරි ප්‍රඥප්තියේ I කොටසේ 7(ආ) ඡේදයට පටහැනිව අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු නොවන අයෙකු 2011 සැප්තැම්බර් මස සිට මගී ප්‍රවාහන අධිකාරියේ සභාපති වශයෙන් පත්කර තිබුණි.

(ඇ) ඌව පළාත් පුස්තකාල සේවා මණ්ඩලය සඳහා විධිමත්ව කාර්ය මණ්ඩලයක් අනුමත කරවා ගැනීමට කටයුතු නොකර නිලධාරීන් තිදෙනෙක් සහ සේවකයන් හතර දෙනෙක් අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් සහ බදුල්ල මහ නගර සභාවෙන් අනුයුක්ත කර තිබුණ අතර නිලධාරීන් දෙදෙනෙක් සහ සේවකයින් දස දෙනෙක් පූර්ණකාලීනව බඳවා ගෙන තිබුණි.

(ඈ) පුරප්පාඩුව පවතින පුස්තකාලයාධිපති තනතුර පිරවීමකින් තොරව එම තනතුරේ සියළුම රාජකාරි කටයුතු ඉහත කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් තාවකාලික පුස්තකාල සේවක පිරිස් වෙත පවරා තිබුණි.

(ඉ) ඌව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ඌව පළාත් පුස්තකාල සේවා මණ්ඩලයේ ස්ථාපිතකර ඇති පරිගණක පුස්තකාලයේ "දැනුමේ සවියෙන් නොසැලී දිරියෙන් " යන සංකල්පය යටතේ මුදල් අයකරමින් පවත්වාගෙන යනු ලබන පරිගණක පාඨමාලා 04 ක සියළු ඉගැන්වීම් හා අනෙකුත් කටයුතු කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන ඇති තාවකාලික නිලධාරියකු වෙත පවරා තිබුණ අතර එම තනතුර සඳහා තිබිය යුතු අධ්‍යාපන සුදුසුකම් වෘත්තීය සුදුසුකම් නියමකර නොතිබුණි. එබැවින් මෙම පාඨමාලාවල ගුණාත්මකභාවය පිළිබඳ තත්ත්වය සනාථ නොවිණි.

(ඊ) ඌව ජනකලා කේන්ද්‍රයේ මධ්‍යස්ථානාධිපතිව සිටි නිලධාරියා විශ්‍රාම ගොස් විගණන දින වන විට මාස 06 කට වැඩි කාලයක් ගතවී තිබුණ නමුත් ඒ සඳහා මධ්‍යස්ථානාධිපති වරයෙකු පත්කර නොතිබුණි. විශ්‍රාම ගිය නිලධාරියා විසින් ඔහු භාරයේ පැවති සංගීත, නැටුම් හා අනෙකුත් උපකරණද ආයතනයට අයත් යතුරු ආදියද විගණන දිනයවූ 2012 පෙබරවාරි 29 දින වන විටත් විධිමත්ව වගකිවයුතු නිලධාරියකුට භාරදීමට කටයුතු කර නොතිබුණි.

(උ) 1989 අගෝස්තු 14 දින පත්වීම් ලැබූ මො/කරගහවෙල විදුහලේ සේවයේ නියුක්ත වසර 22 කට වැඩි සේවා කාලයක් සහිත ගුරු භවතෙකුට පෞද්ගලික ලිපිගොණුවක් නොතිබූ අතර චක්‍රලේඛ ප්‍රකාර වැටුප් පරිවර්තන සිදු නොකොට වැටුප් වර්ධක රහිතව 2011 ඔක්තෝබර් වන විටත් රු. 2,840 ක් තරම් අඩු මූලික වැටුපක් ගෙවා තිබුණි.

(ඌ) බිබිල අධ්‍යාපන කලාපයේ 1972 ඔක්තෝබර් 05 සිට 2011 මැයි 24 දක්වා පත්වීම් ලැබූ ගුරුභවතුන් 55 කගේ අධ්‍යාපන ප්‍රතිඵල 2011 නොවැම්බර් වන විටත් සනාථ කරගෙන නොතිබුණි.

(එ) බිබිල කලාප අධ්‍යාපන කාර්යාලයේ 1996 සිට 2009 ජනවාරි 01 දක්වා කාලය තුළ සහන මුරකරු, සහන කම්කරු, පාසල් රසායනාගාර සේවක හා අරක්කැමි යන තනතුරු සඳහා විධිමත් පත්වීම් ලිපි නොමැතිව සේවකයින් 21 දෙනෙක් සේවය කරමින් තිබුණි.

(ඒ) 2004 පෙබරවාරි 04 දින සංගීත ඩිප්ලෝමා පත්වීමක් ලබාගත් ගුරුවරයකු ඉදිරිපත් කර තිබූ අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාග ප්‍රතිඵල, විභාග දෙපාර්තමේන්තුවේ ලේඛන සමඟ නොසැසඳෙන බව දක්වා තිබුණ නමුත් 2004 පෙබරවාරි 09 සිට 2005 සැප්තැම්බර් 12 දක්වා බිබිල කලාප අධ්‍යාපන කාර්යාලයෙන් රු. 80,897 ක් වැටුප් ගෙවා තිබුණි. 2005 සැප්තැම්බර් 12 න් පසු බදුල්ල අධ්‍යාපන කලාපයේ කොස්ගොල්ල විදුහලේ සේවය කරමින් සිටින මෙම ගුරුවරයාගේ පෞද්ගලික ලිපිගොණුව 2011 නොවැම්බර් වන විටත් බිබිල කලාප කාර්යාලයේ තිබුණි.

(ඔ) 1984 දෙසැම්බර් 02 දින බිබිල කලාපයේ ගුරු සේවයට පත්වීමක් ලැබූ ගුරුවරියක් වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඕ) වැල්ලවාය කලාප අධ්‍යාපන කාර්යාලයේ විෂයභාර සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරුවල වැඩ බැලීමට විදුහල්පති සේවයේ හා ගුරු සේවයේ නිලධාරීන් 10 දෙනෙකු පත්කර තිබූ අතර එක් නිලධාරියෙකුගේ වැඩ බැලීමේ කාලය වසර 18 ක් වූ අතර සෙසු නිලධාරීන් 09 දෙනාගේ වැඩ බැලීමේ කාලය වසර 04 සිට 11 දක්වා විය.

(ක) ආයතන සංග්‍රහයේ 11 පරිච්ඡේදයේ II -1 ප්‍රකාරව වැල්ලවාය කලාප අධ්‍යාපන කාර්යාලය තුළ පරිවාස කාලය ඉක්මවූ සහ සේවා කාලය වසර 04-36 අතර සිටින ගුරුභවතුන් 94 ක් සහ බණ්ඩාරවෙල අධ්‍යාපන කලාපයේ සේවය කරන නිලධාරීන් 96 ක් සහ සේවකයින් 113 ක විගණන දිනවන විටත් ස්ථිර කර නොතිබුණ.

### 2.8.5 දීර්ඝකාලයක් එකම ස්ථානයේ සේවය කරන ගුරුභවතුන් සහ නිලධාරීන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

(අ) 2011 සැප්තැම්බර් මස වනවිට බ/විහාරමහාදේවි බාලිකා විදුහලේ වසර 08 කට වැඩි කාලයක් සේවය කරන ගුරුභවතුන් සංඛ්‍යාව 15 ක් විය.

(ආ) බිබිල අධ්‍යාපන කලාපයේ පාසල් 23 ක විදුහල්පතිවරුන් එකම පාසලේ වසර 08 සිට 19 දක්වා වූ කාලයක් සේවය කරමින් සිට තිබුණි.

(ඇ) වැල්ලවාය කලාප අධ්‍යාපන කාර්යාලයේ සහ කලාපයට අයත් පාසල්වල එකම සේවා ස්ථානයේ අඛණ්ඩව වසර 08 සිට 10 අතර සේවය කරන නිලධාරීන් සංඛ්‍යාව 04 ක්ද වසර 10 සිට 20 අතර සේවා කාලයක් සහිත නිලධාරීන් සංඛ්‍යාව 29 ක්ද, වසර 20 ට වැඩි සේවා කාලයක් සහිත නිලධාරීන් 09 ක්ද විය.

(ඈ) වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තියට පටහැනිව 2011 නොවැම්බර් 11 වනවිට බණ්ඩාරවෙල කලාප කාර්යාලය තුළ වසර 10 ඉක්මවා සේවය කළ නිලධාරීන් සංඛ්‍යාව 05 ක්ද, වසර 6 ත් 10 ත් අතර කාලයක් සේවය කළ නිලධාරීන් සංඛ්‍යාව 07 ක්ද, විය.

## 2.9 වත්කම් කළමනාකරණය

### 2.9.1 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත භෞතික සම්පත්

පහත විග්‍රහකර ඇති පරිදි භෞතික සම්පත් නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවති බව නියැදි පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

| වත්කමේ ස්වභාවය | සංඛ්‍යාව/ වර්ගය/ ප්‍රමාණය | වටිනාකම රු. | නිෂ්ක්‍රීයව පැවති කාලය |
|---|---|---|---|
| වාහන | 02 | ඉදිරිපත් නොවීය | වර්ෂ 01 |
| | 03 | ඉදිරිපත් නොවීය | වර්ෂ 05 |
| | 01 | ඉදිරිපත් නොවීය | වර්ෂ 15 |
| කාර්යාල උපකරණ | 01 | ඉදිරිපත් නොවීය | වර්ෂ 01 |
| | 04 | ඉදිරිපත් නොවීය | වර්ෂ 02 |
| | 02 | ඉදිරිපත් නොවීය | වර්ෂ 04 |
| වෙනත් | 3,322 | 2,407,210 | |
| | | 2,407,210 | |

2.9.2 ලේඛණගත නොකළ වත්කම්

පළාත් සභාවේ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/කාර්යාල තුනක එකතුව රු. 2,291,297 ක් වූ වත්කම් ඒකක 58 ක් මුදල් රෙගුලාසි සහ පළාත් සභා මුදල් සංග්‍රහයේ නියෝග751.1 අනුව ඉන්වෙන්ට්‍රි ලේඛණ සහ තොග ලේඛණවල ලේඛණගත කර නොතිබුණි.

2.9.3 ජංගම නොවන වත්කම් පිළිබඳ වාර්තාවේ ඇතුළත් නොකළ වත්කම්

පළාත් සභාවේ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/කාර්යාලය 10 ක එකතුව රු. 26,684,746 ක්වූ වත්කම් ඒකක 985 ක් විසර්ජන ගිණුම සමඟ ඉදිරිපත් කරන ලද සටහනෙහි දක්වා නොතිබුණි.

2.9.4 භාණ්ඩ සමීක්ෂණය නොකළ ආයතන

පළාත් සභාවේ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/කාර්යාල 06 ක සහ පාසල් 153 ක මුදල් රෙගුලාසි අංක 756 හා 757 අනුව 2011 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ කර නොතිබුණි.

2.9.5 ගබඩා කළමණාකරනයේ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) යෞවන කටයුතු, ක්‍රීඩා, සමාජ සුභසාධන, වතු යටිතලපහසුකම් සංවර්ධන, විදුලිබල හා බලශක්ති සහ පේෂ කර්මාන්ත, කුඩා කර්මාන්ත අමාත්‍යාංශය විසින් ලියාපදිංචි ක්‍රීඩා සමිති වෙත බෙදාදීම සඳහා 2010 හා 2011 වර්ෂවලදී මිළදීගෙන තිබුණ රු.1,531,298 ක් වටිනා ක්‍රීඩා භාණ්ඩ සහ වටිනාකම ගණනය කළ නොහැකි ක්‍රීඩා භාණ්ඩ 459 ක් විගණන දිනයවන 2012 අප්‍රේල් 23 වන විටත් ප්‍රතිලාභීන්ට බෙදා හැර්මට කටයුතු කර නොතිබුණි.

(ආ) 2012 පෙබරවාරි 08 දිනට කිණිගම ගබඩාවේ භෞතික ශේෂය බඩු වට්ටෝරු පොත්වල ශේෂය සමඟ භාණ්ඩ වර්ග 17 කට අයත් ඒකක 162 ක ඌනතාවයක්ද භාණ්ඩ වර්ග 11 කට අයත් ඒකක 151 ක අතිරික්තයක්ද විය.

(ඇ) බණ්ඩාරවෙල කලාප අධ්‍යාපන කාර්යාලයේ තොග ලේඛනයේ දැක්වුන ශේෂය සහ 2012 පෙබරවාරි 08 දිනට තොග ශේෂය අතර භාණ්ඩ වර්ග 19 කට අයත් ඒකක 1633 ක ඌනතාවයක්ද භාණ්ඩ වර්ග 14 කට අයත් ඒකක 206 ක අතිරික්තයක්ද විය.

(ඇ) මොණරාගල නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය විසින් භාවිතයෙන් ඉවත් කරන ලද ද්‍රව්‍ය හා උපකරණ 18 ක් සම්බන්ධයෙන් 2009 නොවැම්බර් 13 දිනැති අංක 438 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව ක්‍රියාකර නොතිබුණි.

(ඉ) ආදායම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ 2011 භාණ්ඩ සමීක්ෂණයෙන් වෙන්දේසි කර තිබුන රු. 25,525 ක වත්කම් ජංගම නොවන වත්කම් සංචලන පිළිබඳ වාර්තාවට ගලපා නොතිබුණි.

(ඊ) ඌව පළාත් මගී ප්‍රවාහන අධිකාරියට අයත් හිටපු සභාපතිවරයා විසින් භාවිතා කළ මෝටර් රථයක් 2011 අගෝස්තු මස ඔහු ධූරයෙන් ඉවත්ව යන විට ආපසු භාරදී නොතිබුණි.

(උ) ඌව පළාත පුස්තකාල සේවා මණ්ඩලයට අයත් බඩු තොග හා ඉන්වෙන්ට්‍රි ලේඛන 2011 ඔක්තෝබර් 07 දින පරීක්ෂා කිරීමේදී ඊට අයත් ප්ලාසටික් පුටු 20 ක්, කැනන් වර්ගයේ බූස්ටර් 01 ක් හා අඩි 10 X15 ටෙන්ට් රෙදි 03 ක ඌනතාවයක් විය.

(ඌ) ඌව පළාත් ජනකලා කේන්ද්‍රයෙහි භාණ්ඩ පිළිබඳව 2012 පෙබරවාරි 29 දින සිදුකළ භෞතික පරීක්ෂාවේදී උඩරට වෙස් ඇඳුම් කට්ටලයක, උඩරට බෙර ඇඳුම් කට්ටලයක හා පිත්තල කොම්බු එකක ඌනතාවයක්ද, දවුල් එකක, තම්මැට්ටම් හා බුම්මැඩි එකක අතිරික්තයක්ද විය.

(එ) ඌව පළාත් පුස්තකාල සේවා මණ්ඩලයට අයත් පුස්තකාල පොත් සම්බන්ධයෙන් 2003 වර්ෂයේ සිට 2011 දක්වා පවත්වා තිබූ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ සම්බන්ධ වාර්තා විගණනයට ඉදිරිපත් නොවුණු අතර, පුස්තකාලයට අයත් පොත් පත් 2009 ජුලි 19 දින සිට එහි පුස්තකාලයාධිපති වශයෙන් කටයුතු කරන නිලධාරිනිය වෙත 2011 ඔක්තෝබර් 13 දින වනවිටත් භාරදී නොතිබුණි.

## 2.9.6 ලැබිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බණ්ඩාරවෙල කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් බණ්ඩාරවෙල සංචාරක නිවාසයේ නවාතැන් ගත් නිලධාරීන් දෙදෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු. 6,450 ක ආදායමක් අයවී නොතිබුණි.

(ආ) 2011 දෙසැම්බර් 31 දිනට රජයේ හා වෙනත් ආයතන වලින් යන්ත්‍ර හා වාහන කුලී, වාහන සේවා ගාස්තු, ශ්‍රමික ගාස්තු වශයෙන් එකතුව රු. 22,239,417 ක්වූ ආදායමක් ඌව පළාත් දිසා යාන්ත්‍රික ඉංජිනේරු කාර්යාලයට ලැබිය යුතුව තිබුණි.

### 2.9.7 නිරවුල් නොකළ අත්තිකාරම්

පළාත් සභාවේ ආයතන 04 ක් විසින් විවිධ පාර්ශවයන් වෙත ලබා දී ඇති අත්තිකාරම් රු. 799,727 ක මුදලක් ආපසු අයකර ගෙන නොතිබුණි.

### 2.9.8 අයවීමට ඇති සේවක ණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2011 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ගිණුම් 12 ක ශේෂවල එකතුව රු. 88,484,333 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ හිඟ හිටි ගිණුම් ශේෂවල එකතුව රු.35,842,761 ක් විය.

(ආ) 2004 ජනවාරි 08 දිනැති අංක 2004/1 දරන ඌව පළාත් ප්‍රධාන ලේකම්ගේ චක්‍රලේඛය අනුව ගිණුම් සාරාංශ මගින් නිරවුල් කළයුතුව තිබුණ එහෙත් නිරවුල් නොකළ ණය ගැති ශේෂ 3,923 ක එකතුව රු. 69,194,021 ක් වූ අතර ස්ථාන මාරුවීම් ලබා පැමිණි නිලධාරීන් වෙනුවෙන් නිරවුල් නොකළ ණය ශේෂ 1,201 ක එකතුව රු. 48,947,241 ක් විය.

(ඇ) සේවය අතහැර ගොස් සිටින, වැඩ තහනම් කර සිටින, මියගිය හා විශ්‍රාම ගිය නිලධාරීන් 40 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.931,505 ක වූ ණය ශේෂයන් ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.2, 4.5 වගන්ති අනුව විශ්‍රාම පරිතෝෂිකයෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකිරීමට හෝ නැතහොත් 4.6 වගන්තිය අනුව එම ණය ශේෂ අය කර ගැනීම සඳහා නීතිපතිගෙන් උපදෙස් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ඌව පළාත් සභාවේ මන්ත්‍රී ධූරය දරා, මියගිය මන්ත්‍රීවරුන් තිදෙනෙකුගෙන් අයවිය යුතු රු.329,531 ක ණය ශේෂය අයකර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. මෙම ණය ශේෂය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 113 හා රාජ්‍ය මුදල් චක්‍රලේඛ 369 අනුව කටයුතු කරන බව 2011 ජූලි 13 දින යූවී/බීඩී/බී/2011/30 M දරන විගණන විමසුමට එවන ලද පිළිතුරුවල සඳහන් ව තිබුණි.

### 2.9.9 වාහන උපයෝජනය

(අ) විගණනයේදී නිරීක්ෂණය වූ වාහන අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි සහ ඌව පළාත් සභා මුදල් රීති අනුව කටයුතු නොකළ අවස්ථා පහත දැක්වේ.

| අමාත්‍යාංශය/කාර්යාලය | වාහන අංකය | අනතුරු සිදුවූ දිනය | අලාභයේ වටිනාකම |
|---|---|---|---|
| | | | රු. |
| ඌව පළාත් මගී ප්‍රවාහන අධිකාරිය | KD 1936 | ඉදිරිපත් නොවීය | 232,588 |
| සභා ලේකම් කාර්යාලය | UPPB-4413 | 2011 නොවැම්බර් 15 | 118,373 |
| යෞවන කටයුතු, ක්‍රීඩා, සමාජ සුභසාධන, වතු යටිතලපහසුකම් සංවර්ධන, විදුලිබල හා බලශක්ති සහ පේෂ කර්මාන්ත, | UPKG 5849 | 2011 අප්‍රේල් 26 | 645,012 |
| කුඩා කර්මාන්ත අමාත්‍යාංශය | UPPB 8641 | ඉදිරිපත් නොවීය | 149,621 |

(ආ) ඌව පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරිය සතු මොටර් රථයක් 2010 වර්ෂයේදී හදිසි අනතුරට ලක්වීමෙන් පසු අළුත්වැඩියා කිරීමට රු. 232,588 ක් වැය කළද රක්ෂණ වන්දි ලෙස රු. 173,085 ක් පමණක් ලැබී තිබුණි. ඉතිරි මුදල වූ රු. 59,503 ක් වගකිව යුතු අයගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.10 හඳුනාගත් පාඩු

නියැදි විගණන පරීක්ෂණවලදී සහ ආයතනයන්හි පවත්වා තබූ තොරතුරු අනුව පහත සඳහන් පාඩු හා හානි අනාවරණය වී ඇත.

(අ) ඌව පළාත් මාර්ගස්ථ මගී පවාහන සේවා අධිකාරියේ වේලා සටහන්කරුවන් තිදෙනෙකු විසින් 2010 වර්ෂය තුළදී භාරගත් ලදුපත් පොත් 04 ක් හා 2011 සැප්තැම්බර් හා ඔක්තෝබර් මාසවලදී භාරගත් ලදුපත් පොත් 10 ක් මඟින් රැසකරන ලද ආදායම් 2012 ජනවාරි 03 වන විටත් භාරදී නොතිබූ අතර, ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 343 ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

(ආ) 2011 අප්‍රේල් 03 දින බාහිර ආයතනයක් වෙත වෙන්කර තිබූ ඌව පළාත් පුස්තකාල ශ්‍රවණාගාර ගොඩනැගිල්ලේ ශාලා පහසුකම් ඔවුනට ලබානොදී අවලංගු කර වෙනත් පාර්ශවයක් වෙත ගාස්තු අයකිරීමකින් තොරව ලබාදීම හේතුවෙන් එදින පුස්තකාල සේවා මණ්ඩලයට රු. 15,000 ක පාඩුවක් සිදුව තිබුණි.

(ඇ) ඌව ජනකලා කේන්ද්‍රය විසින් මිළදී ගත් එකතුව රු.251,000 ක් වටිනා ඇඳුම් කට්ටල 12 ක හා නර්තන උපකරණ 02 ක ඌනතාවයක් විය.

(ඇ) බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මරණාධාර සමිතිවලට ලබාදීම සඳහා මිළදීගත් ලීටර් 500 ජල ටැංකියක් බෙදාහැරීම සනාථ නොවූ අතර එය කාර්යාලයේ ද නොතිබුණි.

(ඉ) බ/තිස්සපුර විදුහලේ ගුරුභවතෙකුගෙන් පදිංචිව සිටි කාලයට අදාල රු. 39,668 ක්වූ හිඟ විදුලි බිල්පත් අයකර ගෙන නොතිබ අතර 2011 ජුලි 12 දින වනවිට ඔහු ස්ථාන මාරුවී ගොස් තිබුණි.

(ඊ) අවශ්‍යතාවය නොසලකා ඔක්කම්පිටිය බීජ ගොවිපළේ ප්‍රයෝජනයට මිලදී ගන්නා ලද රු.238,475 ක් වටිනා කෘෂි රසායන තොගයක් 2012 ජුනි 07 දින වන විට කල් ඉකුත් වී තිබුණි.

(උ) දින 115 ක් වැටුප් රහිත නිවාඩු ලබා ඇති සේවකයෙකුගේ වැටුපෙන් අයකළ යුතු වූ රු.53,053 ක් වෙනුවට රු. 28,200 ක් පමණක් අයකර තිබුණි.

(ඌ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක ත්‍රිපෝෂ බෙදා හැරීමේදී ලබාදී ඇති ප්‍රමාණය හා ලබාගත් බවට සනාථ කර ඇති ප්‍රමාණය අතර ත්‍රිපෝෂ පැකට් 360 කට අදාලව රු.38,244 ක ඌණතාවයක් විය.

(එ) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 22(2) ප්‍රකාරව යෙදවුම් හා නිමැවුම් බදු ගැලපීම් නොකිරීම නිසා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත 2011 වර්ෂයේදී එකතුකළ අගය මත බදු වශයෙන් රු. 451,930 ක් වැඩියෙන් ගෙවා තිබුණි.

---

## 2.11 දූෂ්‍ය වංචනික ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඌව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ සේවය නිරත නිලධාරියෙකු විසින්, ඌව පළාත් පුස්තකාල සේවා මණ්ඩල ගොඩනැගිල්ල උපයෝගි කර ගනිමින් සතියකට දින 03 බැගින් පවත්වාගෙන යන පෞද්ගලික උපකාරක පන්ති සඳහා ඌව පළාත් පස්තකාල සේවා මණ්ඩලයේ හෝ ඌව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ කිසිදු අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

(ආ) ව්‍යාජ නම් යොදා සාවද්‍ය ලෙස ගෙවීම් වවුචර් සකස් කරමින් මොණරාගල නියෝජ්‍ය පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ වර්ෂ ගණනාවක් සිට ඇති වූ මුදල් වංචාව නිසා ඌව පළාත් සභාවට රු.4,537,640 ක පාඩුවක් සිදු වී තිබුණි. මෙම වටිනාකම තුළ සාවද්‍ය ලෙස වැන්දඹු අනත්දරු අරමුදලට අධිභාර , අග්‍රහාර, අත්සන ගාස්තු හා මුද්දර ගාස්තු සඳහා ගෙවා ඇති මුදල රු. 173,329 ක් විය. මේ සඳහා වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 (1) හා (2) පරිද ප්‍රාරම්භක වාර්තාවක් හෝ අවසන් වාර්තාවක් 2011 මැයි 31 වනවිටත් විගණනයට ඉදිරිපත් නොවීය.

(ඇ) 2006 අප්‍රේල් 25 දිනැති අංක 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට පටහැනිව සාවද්‍ය ලෙස වැටුප් පරිවර්ථනය කර 2011 ජුලි 31 දින දක්වා වැටුප් රු. 211,356 ක් ද, දීමනා රු. 1,275 ක් ද, නිවාඩු දින වැටුප් රු. 4,010 ක් ඌව පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ පරිපාලන නිලධාරීට බිබිල කලාප අධ්‍යාපන කාර්යාලයේ සේවය කළ කාලය තුළ වැඩියෙන් ලබා තිබුණි.

(ඈ) අවස්ථා 06 කදී ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගබඩාවට මිළදීගන්නා ලද එකතුව රු. 4,552,713 ක්වූ භාණ්ඩ ගබඩාවට ලැබීමටත් පෙර ඒවා නියමිත පිරිවිතර ප්‍රකාර හොඳ තත්ත්වයෙන් ගබඩාවට ලැබී ඇති බවට තාක්ෂණික කමිටුව ව්‍යාජ සහතික ඉදිරිපත් කර තිබුණි.

(ඉ) 2011 මැයි මාසයේදී බණ්ඩාරවෙල කලාප අධ්‍යාපන කාර්යාලය විසින් සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂකවරයෙක් වෙත සෞන්දර්ය වැඩමුළු 02 ක් පැවැත්වූ බවට ඉදිරිපත් කර තිබූ ව්‍යාජ ලිපිලේඛන මත පදනම්ව රු. 39,000 ක් ගෙවා තිබුණි.

(ඊ) බදුල්ල, නාගදීප හා රිදීමාලියද්ද කෘෂි උපදේශක කාර්යාල වෙත 2010 ජනවාරි 04 දින නිකුත් කර තිබූ රු. 17,170 ක් වටිනා ධාන්‍ය ඇඹරුම් යන්ත්‍රයක් අස්ථානගතව තිබුණි.

## 2.12 ආර්ථික නොවූ ගනුදෙනු

ඌව ජනකලා කේන්ද්‍රය සතුව පැවති නර්තන උපකරණ හා ඇඳුම් කට්ටලද 2010 වර්ෂයේ මිළදීගත් නර්තන උපකරණ හා ඇඳුම් කට්ටල ද නිෂ්කාර්යව පැවතියදී 2011 වර්ෂයේදී ඌව පළාත් රාජ්‍ය නර්තන කණ්ඩායම ස්ථාපිත කිරීම වෙනුවෙන් රු. 2,035,610 ක් වැය කරමින් මිළදීගත් උපකරණ හා ඇඳුම් කට්ටලවල මිළගණන් පිළිබඳව නියැදි පරීක්ෂාවක දී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) විෂයයන් 07 ක සම්බන්ධයෙන් මිලගණන් බදුල්ල නගරයේ මිළ ගණන්වලට වඩා රු. 410 සිට රු. 6,050 ක් දක්වා පරාසයකින් වැඩිවී තිබුණ.

(ආ) එකම වර්ගයේ උපකරණ 06ක මිළ ගණන් 2011 නොවැම්බර් මස මිළ හා 2012 අප්‍රේල් මස පැවති මිළගණන් රු. 150 සිට රු. 8,000 දක්වා වූ පරාසයකින් අඩු වී තිබුණි.

(ඇ) 2010 වර්ෂයේදී මිළදීගෙන භාවිතා නොකර ගබඩා කර තිබුණ උපකරණවල මිළගණන් හා සැසඳීමේදී විෂයයන් 10 කට අදාල මිළගණන් 2011 වර්ෂයට සාපේක්ෂව රු. 630 සිට රු. 12,000 දක්වා වූ පරාසයකින් අඩු වී තිබුණි.

(ඈ) ඌව පළාත් අධ්‍යාපන දෙපාර්මේන්තුවට මිළදීගැනීම සඳහා 2011 ඔක්තෝබර් 24 දින ප්‍රසම්පාදන කමිටුව විසින් නිර්දේශ කරන ලද නර්තන උපකරණ විෂයයන් 03 ක මිළගණන් හා සැසඳීමේදී අධ්‍යාපන අමාත්‍යාංශය විසින් මිළදීගත් උපකරණ සඳහා රු. 640 සිට රු. 14,100 දක්වා වූ ප්‍රමාණයකින් වැඩි මිළක් ගෙවා තිබුණි.

## 2.13 අවිධිමත් ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආණ්ඩුකාර නිල නිවාසය සඳහා ගොඩනැගිල්ලක් පළාත් සභාවට පවරා ගැනීමට අදාල මූලික තක්සේරුව වූ රු. 8,500,000 න් රු. 2,000,000 ක් 2010 වර්ෂයේද රු. 6,500,000 ක් සමාලෝචිත වර්ෂය තුළදී ද බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් කර තිබුණි. තැන්පත් කළයුතු මුදල වූ දළ ඇස්තමේන්තුවෙන් සියයට 25 ක් වන රු. 2,125,000 වෙනුවට මුළු දළ ඇස්තමේන්තුව වන රු. 8,500,000 ක් තැන්පත් කිරීමෙන් රු. 6,375,000 ක් බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිශ්කාර්යව තැන්පත් කර තිබුණි.

(ආ) ඌව පළාත් මගී ප්‍රවාහන අධිකාරිය විසින් 2011 වර්ෂය තුළ මෝටර් රථ 03 ක් අළුත්වැඩියා කිරීම සඳහා අවසථා 05 කදී රු. 76,550 ක් හිටපු සභාපතිවරයාගේ හා සාමාන්‍යාධිකාරි වරයාගේ පෞද්ගලික නම් වලටද, මොණරාගල සිසු සැරිය දැනුවත් කිරීමේ වැඩ සටහන සඳහා ගෙවූ රු. 6,500 ක් ද මොණරාගල ස්ථාන පාලකවරයාගේ පෞද්ගලික නමටද මුදල් ගෙවා තිබුණි.

(ඈ) ඌව ප්‍රජා ගුවන් විදුලි සේවයේ නිලධාරියෙකු විසින් වෙනත් නිලධාරියෙකුට අයත් වැටුප් විස්තරයක් ඉදිරිපත් කරමින් ඉල්ලුම්කර තිබූ ආපදා ණය ඉල්ලුම් පත්‍රයක් වෙනුවෙන් රු.150,000 ක් ආපදා ණය ලබාදී තිබුණි.

(ඇ) රාජ්‍ය නර්තන කණ්ඩායමේ කළ එළි මංගල්‍යය සඳහා වූ සමරු කලාපයේ නිර්මාණය වෙනුවෙන් දරන ලද රු. 36,000 ක් එම නිර්මාණය වෙනුවෙන් ලද රු. 317,500 ක ප්‍රතිපාදන වලින් වැය නොකර ඌව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ වැයකර තිබුණි.

(ඉ) වැලිමඩ කලාප අධ්‍යාපන කාර්යාලයේ 2010 දෙසැම්බර් 31 දිනට නිලධාරීන් තිදෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු. 88,500 ක්වූ ණය ශේෂ හේතු රහිතව අත්තිකාරම් ගිණුමෙන් කපා හැර තිබුණි.

(ඊ) විධිමත් අවසරයක් නොලබා විදේශගත වීම නිසා 2011 ජනවාරි මස සිට වැටුප් ගෙවීම නතර කර තිබූ බදුල්ල දිස්ත්‍රික්කයේ විද්‍යාලයක ගුරුවරියකට 2011 මාර්තු 20 දින රු. 100,000 ක් ආපදා ණය ගෙවා තිබුණි.

(උ) විනය පරීක්ෂණ නිලධාරී ලෙස කටයුතු කළ නිලධාරියෙකුට කැටවල, ලන්දෙවෙල සිට මොණරාගල දක්වා සාමාන්‍ය දුර කි.මී.80 ක් ගමන් කිරීම වෙනුවෙන් යෙදුන දුර කි.මී.148 ක් ලෙස දක්වා රු.16,320 ක් ප්‍රවාහන දීමනා වැඩිපුර ගෙවා තිබුණි.

(ඌ) පළාත් යාන්ත්‍රික ඉංජිනේරු කාර්යාලයේ අනුමත නොවූ ගණකාධිකාරී තනතුරේ වසර 04 ක කාලයක් රාජකාරී ඉටුකිරීම වෙනුවෙන් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලයේ ගණකාධිකාරීවරයාට අතිරේක පාරිශ්‍රමිකයක් වශයෙන් රු. 237,381 ක් ද, නිවාඩු දින වැටුප් රු. 96,338 ක් ද, ගෙවා තිබුණි.

(එ) පළාත් යාන්ත්‍රික අධ්‍යක්ෂකගේ නිවාස දුරකථනය හා කාර්යාල දුරකථනය සඳහා 2010 වර්ෂය වෙනුවෙන් වැයකළ මුළු බිල්පත් ගාස්තුවෙන් අනුමත සීමාව නොසලකා ජංගම දුරකථන ගාස්තු රු. 17,358 ක් පතිපූරණය කර තිබුණි.

(ඒ) **ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2011 ජුලි 08 දින ඌව පළාත් පුස්තකාල සේවා මණ්ඩලයේ ප්‍රධාන ශ්‍රවණාගාර වේදිකාවේ විදුලි ආලෝක පද්ධතිය අළුත්වැඩියා කිරීම සඳහා විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අනුගමනය නොකර, වියදම් ඇස්තමේන්තුවක් අනුමත නොකර පෞද්ගලික ආයතනයකින් අළුත්වැඩියා කටයුතු සිදු කරගෙන තිබුණි. කොන්ත්‍රාත්කරු ඉදිරිපත් කර තිබුන රු. 34,750 ක්වූ බිල්පත් වෙනුවෙන් රු. 12,000 ක් ගෙවා තිබුණි. 2011 ඔක්තෝබර් 13 විගණන දිනය වනවිට එම ආලෝක පද්ධති කට්ටල 17 න් 05 ක් පමණක් ක්‍රියාත්මක තත්ත්වයේ පැවතිණි.

(ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ I පරිච්ඡේදයේ 1.2.1 හි විධිවිධාන ප්‍රකාර ප්‍රසම්පාදන ක්‍රියාමාර්ග අනුගමනය නොකර බදුල්ල බාලිකා විද්‍යාලයක පාසල් ආපන ශාලාව 2007 මැයි මස සිට 2011 සැප්තැම්බර් දක්වාම එකම පුද්ගලික ආයතනයකට වසර 04 කට වැඩි කාලයකට බදු දී තිබුණි.

(ඔ) **භාණ්ඩ හා සේවා සැපයීම් රහිතව මුදල් නිදහස් කිරීම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). මුදල් රෙගුලාසි 137(5) සහ 237(ආ) හි විධිවිධාන වලට පටහැනිව කිණිගම ප්‍රධාන ගබඩාවට භාණ්ඩ මිළදීගත් අවස්ථා 11 කදී භාණ්ඩ ලැබීමට පෙර රු. 4,840,326 ක් ගෙවා තිබුණි.

(ii). ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් අධ්‍යාපන අංශ සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ලැබී තිබුණ මුදලින් 2011 මැයි 27 දින රු. 349,944 ක් ගෙවා මිළදී ගන්නා ලද ක්‍රීඩා උපකරණ විගණිත දිනය වූ 2012 පෙබරවාරි 08 දින වන විටත් ලැබී නොතිබුණි.

(ඕ) **ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඌව පළාත් මගී ප්‍රවාහන අධිකාර ප්‍රඥප්තියේ අංක 15 වගන්තිය ප්‍රකාර මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟතාවය ලබානොගෙන අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය පමණක් ලබාගෙන 2011 වර්ෂය තුළදී සාමාන්‍යාධිකාරීවරයාට රු. 354,105 ක් සහ සභාපතිවරයාට රු. 292,620 ක් ඉන්ධන දීමනා ගෙවා තිබුණි.

(ii) ඌව පළාත් පුස්තකාල සේවා මණ්ඩලය සතු ප්‍රධාන ශ්‍රවණාගාරය සහ දේශන ශාලාව සාධාරණ පදනමකින් අනුමත ගාස්තු අය නොකර අවස්ථා 44 කදී කුලියට දී විවිධ පුද්ගලයින්ගෙන් හා ආයතනවලින් එකතුව රු. 225,900 ක් අයකර ගෙන තිබුණි.

(iii) 2010 ජනවාරි 01 සිට 2011 ඔක්තෝබර් 13 දින දක්වා ඌව පළාත් පුස්තකාල සේවා මණ්ඩලයට අයත් ප්‍රධාන ශ්‍රවණාගාරය හා දේශන ශාලාව බාහිර පාර්ශවයන්ට වෙන්කරදීම වෙනුවෙන් අවස්ථා 115 කදී ගාස්තු අයකර නොතිබුණු අතර ඒ සඳහා අවම ගාස්තුවවත් අයකළේ නම් රු. 542,000 ක් අයකර ගතහැකිව තිබුණි.

## 2.14 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඌව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය හා රාජ්‍ය නොවන සංවිධානයක් අතර ඇති කරගත් ගිවිසුමකට අනුව ඌව පළාත් පුස්තකාල සේවා මණ්ඩලයේ මොණරාගල දිස්ත්‍රික් මධ්‍යම පුස්තකාලය සඳහා පහසුකම් ලබාදීම වෙනුවෙන් ලබාදී තිබූ රු. 2,000,000 කින් රු.1,998,938 ක් ගෙවා මිලදීගත් පුස්තකාල පොත් ඇතුළු කාර්යාල උපකරණ 2011 දෙසැම්බර් 31 වන විටත් මොණරාගල පුස්තකාලය වෙත ලබාදී නොතිබුණු අතර රු. 72,500 ක් ගෙවා මිළදී ගෙන තිබූ පරිගණකයක් අධ්‍යාපන අමාත්‍යාංශයේ ගිණුම් අංශයේ පරිහරණයට ගෙන තිබුණි. අනෙකුත් උපකරණ නිෂ්කාර්යව ඌව පළාත් පුස්තකාල සේවා මණ්ඩල ගොඩනැගිල්ලේ ගබඩා කර තිබුණු අතර ඉන් පොත් රාක්ක, කියවීම් මේස හා කුෂන් පුටු කිහිපයකට අලාභහානි සිදුවී තිබුණි.

(ආ) ඌව පළාත් පුස්තකාල සේවා මණ්ඩල ගොඩනැගිලි සංකීර්ණය තුළ පුස්තකාල සේවා මණ්ඩල කාර්යාලය, ශ්‍රවණාගාරය, මධ්‍යම පුස්තකාලය ඌව පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරි කාර්යාලය, කහගොල්ල යාන්ත්‍රික ඉංජිනේරු කාර්යාලයට අයත් ඒකකය හා ආපන ශාලාව වශයෙන් කොටස් 6 ක් ක්‍රියාත්මක වන අතර ආපන ශාලාව හැර අනෙකුත් සියළු ඒකක සඳහා එකම මනුවකින් විදුලිය සපයා තිබුණි. මාසික විදුලි පරිභෝජනය වෙනුවෙන් රු. 29,000 සිට රු. 73,000 දක්වා මුදලක්ද, ජල පරිභෝජනය වෙනුවෙන් රු. 7,000 සිට රු. 17,000 දක්වා මුදලක්ද වැය කර තිබුණි. විදුලිය හා ජල බිල්පත් වලින් සියයට 5 ක් ආපනශාලාවෙන් අයකර ගැනීමෙන් අනතුරුව ඉතිරිය අමාත්‍යාංශය විසින් දරනු ලබන නමුත් අනෙකුත් ආයතනවලින් මේ සඳහා කිසිදු මුදලක් අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

(ඇ) ඌව පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරියෙ වේලා සටහන්කරුවන් තිදෙනෙකු විසින් උපපත්‍රිකා පොත් 39 කින් රැස් කරන ලද රු. 1,370,600 ක් මාස 01 ත් 03 ත් අතර කාල ප්‍රමාදයක් සහිතව කාර්යාලයට භාරදී තිබුණි.

(ඈ) ඔහිය ක්ෂේත්‍ර පුහුණු මධ්‍යස්ථානය ඉදි කරනු ලබන ඉඩමේ මූලික පිඹුරුපත්, මිනින්දෝරු සැලැස්ම ආදිය ලබාගෙන ඉඩමේ මායිම්වල නිවැරදිතාවය සම්පූර්ණ කරගෙන නොතිබුණි. බෑවුම් සහිත වූ මෙම භූමිය තෝරා ගැනීම සහ පිහිටීම පිළිබඳව භූමියේ ස්වභාවය පිළිබඳව අවධානය යොමුකර ගොඩනැගිලි ඉදිකිරීම පිළිබඳ සැලසුම් සකස් නොකිරීම හේතුවෙන් ඇස්තමේන්තුවේ අයිතම අංක 10 යටතේ දැක්වෙන පරිද රු. 5,867,002 ක විශාල වියදමක් දරා භූමිය ඉදිරිපස ආරක්ෂිත බැම්මක් ඉදිකරමින් තිබුන අතර, ඉදිරියේදීද ආරක්ෂිත බැම් වෙනුවෙන් තවදුරටත් වියදම් දැරීමට සිදුවන බව නිරීක්ෂණය විය. වෙනත් සුදුසු ඉඩමක් ලබාගැනීමකින් තොරව මෙම ඉඩම තෝරා ගැනීම හා ස්වභාවික පිහිටීම පිළිබඳ අවධානය යොමු නොකර සැලසුම් සකස් කිරීම හේතුවෙන් මෙම වියදම් රජයට දරන්නට සිදුවන අමතර වියදමක් ලෙස විගණනයේදී නිරීක්ෂණය විය. හෝර්ටන්තැන්න රක්ෂිතයට මායිම්ව පිහිටි කාමර 11 කින් යුක්ත මෙම පුහුණු මධ්‍යස්ථානයේ මුළුතැන්ගෙයින් ඉවතලන අපද්‍රව්‍ය බැහැර කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කර ඒ සඳහා ගතයුතු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 2.15 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ඌව පළාත් සභා අරමුදලට අයත් ප්‍රධාන ජංගම ගිණුමේ මාසික සාමාන්‍ය ශේෂය රු. මිලියන 430 ක වර්ෂය පුරා නිශ්කාර්යව පැවතුණි.

(ආ) ඌව පළාත් සභාවට අයත් ප්‍රධාන ජංගම ගිණුමෙන් සාමාන්‍ය ඉතිරිකිරීමේ ගිණුමට සමාලෝචිත වර්ෂයේ ජූනි සහ ජූලි යන මාසවලදී මාරුකර තිබුණ රු. 425,000,000 ක් 2011 වර්ෂයේ ආරම්භයේදීම මාරු කලේ නම් රු. 7,833,300 ක අමතර දළ පොළ ආදායම් උපයා ගැනීමට හැකියාව තිබුණි.

(ඇ) 2009 වර්ෂයේදී කුඩා මුත්තෙට්ටුව නැමැති ඉඩම අත්කර ගැනීම වෙනුවෙන් බදුල්ල ප්‍රාදේශීය ලේකම්ගේ දළ ඇස්තමේන්තුව වූ රු. 1,500,000 ක්ද, 2011 වර්ෂයේදී රු.783,000 ක්ද, බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් කර තිබුණි. තක්සේරු දෙපාර්තමේන්තුව ඉඩමට අදාල තක්සේරු වටිනාකම නිශ්චිතව දක්වා නොමැතිව, තැන්පත් කළයුතු නියමිත මුදල වන දළ ඇස්තමේන්තුවෙන් සියයට 25 ක් වූ රු. 375,000 ක් වෙනුවට මුළු දළ ඇස්තමේන්තු ඇතුළුව රු. 2,283,000 ක් තැන්පත් කිරීමෙන් රු. 1,908,000 ක් නිශ්කාර්යව දීර්ඝ කාලයක් බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් ලෙස පැවතුණි.

(ඈ) 2011 දෙසැම්බර් 31 දිනට ඌව පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් පළාත් පාලන ආයතනවලට නිදහස් නොකර රඳවාගෙන තිබුණ මුද්දර ගාස්තු ආදායම් රු.267,968,094 ක් වූ අතර නිදහස් නොකළ උසාවි දඩ ආදායම් රු. 191,651,642 ක් විය.

(ඉ) 2011 වර්ෂය තුළදී මුද්දර ගාස්තු ආදායම් වශයෙන් පළාත් සභාවට ලැබුණු රු. 125,582,791 කින් ඌව පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් පළාත් පාලන ආයතන වෙත නිදහස් කර තිබුණේ රු. 12,864,365 ක් පමණක් වන අතර සමාලෝචිත වර්ෂයේ රු. 96,156,135 ක උසාවි දඩ ආදායමෙන් නිදහස් කර තිබුණේ රු. 9,069,360 ක් පමණි.

(ඊ) 2011 වර්ෂයේදී මුද්දර ගාස්තු ආදායම්වලින් ප්‍රාදේශීය සභා 12 කටද උසාවි දඩ ආදායම් වලින් ප්‍රාදේශීය සභා 09 කටද කිසිදු මුදලක් ලබා දී නොතිබුණි.

(උ) ප්‍රතිලාභීන් දෙදෙනෙකු විසින් රෝගී තත්ත්වයන් මත කළ ඉල්ලීම් අනුව ප්‍රධාන අමාත්‍ය අරමුදලින් රු. 100,000 ක ආධාර මුදලක් ලබාදීමට වර්ෂයකට ආසන්න කාලයක් ගත වී තිබූ අතර ලබාදුන් ආධාර මුදල් වෙනුවෙන් ලියූ චෙක්පත් බැංකුවට ඉදිරිපත් කර තිබුණේ ඒවා ගෙවූ දින සිට මාස 07 කට අධික කාලයක් ගතවීමෙන් අනතුරුවය. එම ප්‍රතිලාභ අදාල ප්‍රතිලාභීන් වෙතම ලබාදුන් බවට සනාථ කිරීමක් ඉදිරිපත් නොවීය.

(ඌ) 2011 සැප්තැම්බර් 09 දිනැති අංක 1722/27 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයේ 01 වගන්තියට අනුව 2011 ඔක්තෝබර් 01 දින සිට ප්‍රධාන ලේකම් කාර්යාලයේ ක්‍රියාත්මක විය යුතුව තිබූ මෝටර් වාහන වෙනුවෙන් අයකරනු ලබන වාර්ෂික ආදායම් බලපත්‍ර ගාස්තු සංශෝධනය ඌව පළාත තුළ 2012 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මකවීම නිසා රු. 4,029,020 ක වූ බලපත්‍ර ගාස්තු හා දඩ මුදල් ආදායමක් පළාත් සභාවට අහිමි වී තිබුණි.

(එ) පස්සර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2011 වර්ෂයේ උපමාන පාදක ආයෝජන වැඩසටහන යටතේ වූ රු. 387,500 ක ව්‍යාපෘති යෝජනා 17 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඒ) සුරාබදු කොමසාරිස් ජනරාල්වරයාගේ 2010 සැප්තැම්බර් 27 දින අංක ඊසී/ජී/ආර්/එල්/2011 දරන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව නියමිත කාලය තුළ සුරාබදු බලපත්‍ර ලබා නොගත් හාලි ඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ බලපත්‍රධාරීන් දෙදෙනෙකුගෙන් රු. 80,500 ක් ද, බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ බලපත්‍රධාරීන් 06 දෙනෙකුගෙන් 76,049 ක් ද, ප්‍රමාද ගාස්තු අඩුවෙන් අයකර තිබුණි.

(ඔ) උපමාන පාදක ආයෝජන වැඩසටහන යටතේ බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2011 වර්ෂය තුළදී ප්‍රතිලාභීන් 42ක් අතර බෙදාහරින ලද රු. 629,259 ක් වටිනා ද්‍රව්‍යාධාර සම්බන්ධයෙන් ඒවා නිශ්චිත කාර්යයන්ට යොදා ගත්තේද යන්න පිළිබඳ පසු විපරම් කටයුතු සිදුකර නොතිබුණි.

(ඕ) භාවිතයට ගත හැකි නමුත් පාවිච්චියට නොගන්නා මෝටර් සයිකල් 05 ක් කාර්යාලයේ තිබියදී රු.139,900 ක් වැය කර 2010 දෙසැම්බර් 29 දින නව මෝටර් සයිකලයක් මිලදී ගෙන ගෙන තිබුණි.

(ක) මහියංගණය දඹාන ප්‍රදේශයේ ගොවීන් 48 ක් වෙත වගා කිරීම සඳහා රු.126,945 ක් වටිනා බෝංචි බීජ කිලෝ ග්‍රෑම් 93 ලබා දී තිබුණි. එහිදී නියැදි පදනමක් මත තෝරාගත් ප්‍රතිලාභීන් 10 දෙනෙකුට ලබා දී තිබූ රු. 13,650 ක් වටිනා බෝංචි බීජ කිලෝ ග්‍රෑම් 21 ක් පරීක්ෂා කිරීමේදී කිසිඳු ඵලදාවක් නොලැබීම නිසා ගොවීන් දැඩි අපහසුතාවයකට පත්ව තිබුණි.

(ග) දිසා යාන්ත්‍රික කාර්යාලයට අයත් අබලන් වී ඇති යන්ත්‍ර 06 ක් අළුත්වැඩියා කිරීමට අවශ්‍ය අමතර කොටස් වෙළඳපළේ නොමැති වීමෙන් 2008 වර්ෂයේ සිට කාර්යාල භූමියේ ගාල්කර තිබෙන අතර ඒ අනුව එම යන්ත්‍ර අපහරණය කිරීමට හෝ වෙනත් ක්‍රියාමාර්ගයක් ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.

## 2.16 කාර්ය සාධනය

### 2.16.1 අරමුණුවලට පටහැනි ක්‍රියාකාරකම්

2011 ජුනි සිට නොවැම්බර් දක්වා බදුල්ල මහ රෝහලේ ලිංගාශ්‍රිත රෝග මර්ධන ඒකකයේ මල්ටි ස්කෑන් ඊ එකස් (රීඩර්) ලැබ් සිස්ටම් (Multiskan EX (Reader) Lab Systems) යන්ත්‍රය අළුත්වැඩියා කිරීම සඳහා යොමු කර තිබුන කාලය තුල එම යන්ත්‍රය උපයෝගී කරගෙන එච්.අයි.වී එලයිසා (HIV Elisa) පරීක්ෂණ 2,578 ක් කර ඇති බව වී.ඩී.ආර්.එල් (VDRL) ලේඛනය අනුව සනාථ විය. යන්ත්‍රය අක්‍රීයව තිබූ කාලය තුල එච්.අයි.වී එලයිසා (HIV Elisa) පරීක්ෂණ සිදුකර රෝගී විනිශ්චයන් ලබාදීම සාවද්‍ය තොරතුරක් යන්න විගණනයේදී බැහැර කළ නොහැකිය. මෙම යන්ත්‍රය භාවිතා නොකර ලබා දෙන ලද වාර්තා වල නිවැරදිභාවය සැකයට හේතුවේ.

### 2.16.2 ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ අරමුණු

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ඌව පළාත සඳහා රාජ්‍ය සංගීත කණ්ඩායමක් ස්ථාපිත කිරීමේ අරමුණින් 2010 වර්ෂයේදී ශිල්පීන්ගෙන් අයදුම්පත් කැඳවා ඒ සඳහා විශේෂිත වූ පරීක්ෂණ මණ්ඩලයක් පත්කර සම්මුඛ පරීක්ෂණ පවත්වා ශිල්පීන් තෝරාගෙන, උපකරණ සඳහා රු. 908,310 ක් වැයකර වර්ෂ දෙකකට අධික කාලයක් ගතවී ඇති නමුත් 2012 දෙසැම්බර් 31 දක්වා සංගීත කණ්ඩායම ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණ.

(ආ) පළාතේ පදිංචි පාසැල් හැර ගිය තරුණ තරුණියන්ගේ කලා කුසලතා නංවාලීම, පළාතේ සංස්කෘතික වටිනාකම් ආරක්ෂාකොට අනාගත පරපුර වෙත දායක කරලීම, පළාත් වාසීන්ගේ රසවින්දනය ඉහළ නැංවීම සහ රාජ්‍ය හා රාජ්‍ය නොවන උත්සව සඳහා අවශ්‍ය සංස්කෘතික අංග සපයාදීම ඇතුළු අරමුණු රාශියක් මුල්කර ගනිමින් කොළඹ සෞන්දර්ය විශ්වවිද්‍යාලයේ තාක්ෂණික උපදේශකත්වය හා අධීක්ෂණය යටතේ 2011 වර්ෂයේදී රු. 4,551,850 ක් වැය කරමින් ස්ථාපිත කළ පළාත් රාජ්‍ය නර්තන කණ්ඩායම, ශිල්පීන් කණ්ඩායම අතහැරයාම, පුරප්පාඩු පිරවීම සඳහා ක්‍රියා නොකිරීම, වියදමට සාපේක්ෂව ආදායම් නොලැබීම සහ පුහුණු කටයුතු සඳහා ස්ථිර ගුරුවරයෙකු නොවීම යන හේතු මත අසාර්ථකව තිබුණි. 2011 වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම රු. 1,395,000 ක් වන නමුත් නර්තන කණ්ඩායම ස්ථාපිත කර මාස 09 ක් ඉක්මා ඇති විගණන දිනය වූ 2012 ජුලි 25 වනවිටත් කිසිදු ආදායමක් උපයා නොතිබුණි.

(ඈ) වේලිඔය 2006 පරිසර සංරක්ෂණ වැඩ සටහන
ප්‍රතිපාදනය රු. 2,905,923

ඉහත ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(i) වැඩසටහන සඳහා සලසා තිබූ රු. 2,905,923 ක ප්‍රතිපාදනයෙන් රු. 339,553 ක් පමණක් වැයකර තිබුණු අතර එය ප්‍රතිපාදනයෙන් සියයට 11.6 කි.

(ii) 2012 ජනවාරි මාසයේ දී මෙම ව්‍යාපෘතිය පරීක්ෂා කිරීමේදී වන වගාව සඳහා තෝරා ගෙන තිබුණ නිශ්චිතව හඳුනාගත් හෙක්ටයාර් 05 ක භූමි ප්‍රමාණයක් පර්චස් 180 ක් පමණක් වන වගාව සඳහා යොදාගෙන තිබුණ.

(iii) මො/නාලන්දා මහ විදුහලේ යුගල නිල නිවාස ඉදිකිරීමට සහ මො/ලගිනගල කනිටු විදුහලේ පුස්තකාල ගොඩනැගිල්ල ඉදි කිරීමට වෙන් කර තිබුණ රු.5,000,000 කින් අදාල ඉදිකිරීම් සිදු කර නොතිබුණ.

(iv) මිදිපැල ඒකක 50 ක් ස්ථාපිත කිරීම සඳහා ලබාදී තිබුණද මිදි පැල සියල්ලම විනාශ වී තිබුණ

(v) නීලමහා ගල් අමුණ ව්‍යාපෘතිය යටතේ රු.189,568 ක් වැය කොට සවිකර තිබුණ ඇලෙහි පිටවානේ (වැලි ගේට්ටුව) දොරෙහි බාල්කය දෙපස කණුවලින් වෙන් වී ගැලවී ජලය පිටතට කාන්දු වෙමින් තිබුණි.

(vi) නිසි ශක්‍යතා අධ්‍යනයක් නොකර වගා කිරීම සඳහා පැල වර්ග ලබාදීම නිසා අළුත්වැව මිල්ලගම පදිංචි ගොවි මහතෙකු වගා කරන ලද අක්කර 6.5 ක ඉඩම වන සංරක්ෂණ ප්‍රදේශයක් ලෙස නීතිගත වීමෙන් අඹ පැල 40 ක්, පොල් පැල 32 ක්, දොඩම් පැල 100 ක් ඇතුලු වගා ඉඩම ඔහුට අහිමිවී තිබුණ.

(ඉ) ලංකා විදුලිබල මණ්ඩලය වෙත රු.13,245,101 ක් ගෙවා දියතලාව මූලික රෝහලේ දැඩි සත්කාර ඒකකයට 2010 සැප්තැම්බර් 17 දින සපයා සවිකර තිබුණ මධ්‍යගත වායු සමීකරණ පද්ධතිය සවි කළ දින සිට නිසිලෙස ක්‍රියාත්මක නොවීමෙන් විශේෂඥ වෛද්‍ය නිලධාරීන් ඇතුලු රෝහල් කාර්යය මණ්ඩලය දැඩි අපහසුතාවයකට පත්ව තිබුණි.

## 2.17 කොන්ත්‍රාත් පරිපාලනය

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

### (අ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

2010 ඔක්තෝබර් 02 දින ගිවිසුම් අත්සන් කරන ලද කොන්ත්‍රාත්තුවේ වටිනාකම රු.856,026,287 ක් වූ ඌව පළාත් මාර්ග ඉදිකිරීම් ව්‍යාපෘතිය යටතේ ගලඋඩ, කන්දකැටිය, කරමැටිය මාර්ගය පුනරුත්තාපනය සහ වැඩි දියුණු කිරීමේ කර්මාන්තය වසර 2 කින් එනම් 2012 ඔක්තොබර් 30 දින නිමකල යුතුව තිබුණි. මෙම කර්මාන්ත පිළිබඳව 2011 නොවැම්බර් මස සිදුකල විගණන පරීක්ෂාවේදී පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) කොන්ත්‍රාත්තු කාලයෙන් සියයට 50 කට වැඩි කාලයක් ගතවී ඇති නමුත් 2011 නොවැම්බර් 09 දින අවසන් වරට ගෙවා ඇති බිල්පත පරිදි කොන්ත්‍රාත්තුවේ සමස්ත කළ වැඩවල වටිනාකම රු.57,225,328 ක් විය. ඒ අනුව කොන්ත්‍රාත් ඉදිකිරීම්වල භෞතික ප්‍රගතිය සියයට 6.67 වැනි ඉතා පහළ මට්ටමක පැවති අතර කොන්ත්‍රාත්තුවේ මූලික ඉදිකිරීම් කාර්යයන් 5 හි කළ වැඩ වටිනාකමද ඉතා පහළ මට්ටමක පැවතුණි. එසේම මෙම කාර්ය 2013 දෙසැම්බර් මස අවසන් වන විටත් නිමකර නොතිබුණු අතර 2013 දෙසැම්බර් 31 දිනට ඉදිකිරීම්වල භෞතික ප්‍රගතිය රු.454,486,988 ක් එනම් සියයට 52 ක් වී තිබුණි.

(ii) ප්‍රධාන ඉදිකිරීම් අයිතමයන් 15 ක ගිවිසුම්ගත ප්‍රමාණ පත්‍රයේ සඳහන් වැඩ වලින් ඉටුකල වැඩ වල ප්‍රමාණයන් සියයට 0.4 සිට සියයට 53 අතර පරාසයක තිබුණි.

(iii) කොන්ත්‍රාත්කරු විසින් එතෙක් කිසිදු ඉදිකිරීමක් ආරම්භ නොකළ ප්‍රධාන අයිතමයන් 13 ක වටිනාකම රු.මිලියන 200 ඉක්මවා තිබුණි.

(iv) වසර දෙකක ගිවිසුම්ගත කොන්ත්‍රාත් කාලයෙන් සියයට 50 ක් ඉක්ම ගොස් තිබියදී මුල් කොන්ත්‍රාත් මුදල රු.මිලියන 122.9 කින් හෙවත් සියයට 16 කින් සංශෝධනය කර තිබුණි. විෂයන් 21 ක සංශෝධිත ඇස්තමේන්තු වල ප්‍රමාණ පත්‍ර වල ප්‍රමාණයන් ගිවිසුම්ගත ප්‍රමාණ පත්‍ර වල ප්‍රමාණයන් සමඟ සියයට 59 සිට සියයට 11011 දක්වා වෙනස් වී තිබුණි.

(v) කොන්ත්‍රාත්කරුට ගෙවා තිබූන රු.110,760,124 ක් වූ කාර්ය පූර්ව අත්තිකාරම් මුදලින් කිසිදු මුදලක් 2011 නොවැම්බර් මස වන විටත් අයකරගෙන නොතිබුණු අතර 2013 දෙසැම්බර් මස වන විට තවදුරටත් අයකරගත යුතු මුදල රු.78,270,488 ක් විය.

(vi) අනිවාර්ය කාර්යය මණ්ඩලයේ තනතුරු 04 ක් 2011 දෙසැම්බර් මාසයේ විගණන අවස්ථාව වන විටත් පුරප්පාඩුව පැවති අතර නොවැම්බර් මාසයට යෝජිතව තිබුණ යාන්ත්‍රික පැය 4530 සඳහා කම්කරුවන් වැඩ කර තිබුණේ යාන්ත්‍රික පැය 3208 ක් පමණි.

(vii) කොන්ත්‍රාත්කරුගේ ඉදිකිරීම් කටයුතු වලට අදාල පරීක්ෂාවට ලක්කරන නියැදිය පරීක්ෂණයේදී අසමත් වන විට එම කාර්යය නැවැත්වීමට හෝ නිවැරදි කිරීමට උපදේශක සමාගමේ නිලධාරීන්ට හැකියාවක් නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය.

(viii) උපදේශක සමාගමේ අදාල තාක්ෂණ නිලධාරීන් සමග කිලෝමීටර් 3+670 දරණ ස්ථානයේ ඉදිකරන පාලමට කොන්ක්‍රීට් යොදන අවස්ථාවේ සිදුකල ස්ථානීය පරීක්ෂාවේදී ගෙනෙන ලද මීටර් කියුබ් 2.5 ක කොන්ක්‍රීට් ප්‍රමාණයක බැහුම් පරීක්ෂණ (Slump testing) නියැදි පරීක්ෂාව අසමත් වී තිබුණ අතර ප්‍රතිඵලය මිමී 100 මිමී 150 අතර තිබිය යුතු එම නියැදියේ අගය මිමී 70 ක් විය. එසේ තත්ත්ව පරීක්ෂාවෙන් අසමත් වූ කොන්ක්‍රීට් මිශ්‍රණය පාලමට යොදනු ලැබූ අතර එය වැලැක්වීමට හෝ නිවැරදි කිරීමට උපදේශක සමාගමේ තාක්ෂණ නිලධාරීන්ට හැකියාවක් නොතිබුණි.

(ix) ඉදිකිරීම් අවසන් කර තිබූ බෝක්කු 51 කින් බෝක්කු 08 ක් පිළිබඳ සිදු කරන ලද කොන්ක්‍රීට් කුට්ටිගල් වල සම්පීඩන ශක්තිය මැනීමේ පරීක්ෂණය (Compressive Strength test on concrete cube) පරීක්ෂණය අසමත් වී තිබණි. එම පරීක්ෂණයේ 20/20 ලෙස තිබිය යුතු අගය තත්ත්ව පරීක්ෂාවේදී 14 ත් 19 ත් අතර අගයන් ගෙන තිබුණි.

(x) ව්‍යාපෘතියට අදාලව බෝක්කු 136 ක් ඉදිකිරීමට හඳුනාගෙන තිබූ අතර ඉන් කිලෝමීටර් 15+020 සිට කිලෝමීටර් 19+967 දක්වා බෝක්කු 17 ක් සඳහා වූ සැලැස්ම (Drawings) මෙතෙක් උපදේශක සමාගම විසින් අනුමත කිරීමට කටයුතු කර නොතිබුණි.

(xi) මාර්ගය පුළුල් කිරීමේදී නැවත ස්ථාපනය කළ යුතු යැයි හඳුනාගන්නා ලද විදුලි කණු 96 සහ දුරකථන කණු 120 ව්‍යාපෘති කාල සීමාවෙන් සියයට 50 ක් ඉක්මවා ගොස් තිබියදීත් නැවත ස්ථාපනය කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණ අතර මාර්ගයේ ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වීමට මෙම කරුණුද හේතු වී ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) **ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම්**

මොණරාගල ප්‍රාදේශීය ඉංජිනේරු (ගොඩනැගිලි) කාර්යාලය විසින් 2010 දෙසැම්බර් 23 දින රු.5,160,748 ක ඇස්තමේන්තු පිරිවැයකට ආරම්භකර තිබූ කුඹුක්කන ගිමන්හලේ රථගාල හා වැසිකිළි පද්ධතිය ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2011 දෙසැම්බර් 31 දිනවන විට රු.1,030,000 ක වැඩ අවසන් කරතිබූ අතර ප්‍රදේශවාසීන්ගෙන් එල්ල වූ විරෝධතා හේතුවෙන් ව්‍යාපෘතිය නිම නොකර අතහැර දමා තිබුණි.

(ඇ) **ඉදිකිරීම්**

ඉදිකිරීම් කටයුතු පිළිබඳ ක්ෂේත්‍ර පරීක්ෂණවලදී දක්නා ලද අඩුපාඩු පහත දැක්වේ.

(i) බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සපුගස් උල්පත කෙත්යාය හා ඇල මාර්ගයට හානිවීම වැලැක්වීමට බැම්මක් ඉදිකිරීම සඳහා සපුගස් උල්පත ගොවි සංවිධානයට රු. 421,101 ක් ගෙවා තිබූ අතර භෞතික පරීක්ෂාවේදී පෞද්ගලික ඉඩමක හා නිවසක නාය යෑම වැලැක්වීම සඳහා මෙම බැම්ම ඉදිකර තිබුණි.

(ii) ඉසුරු පාසල් ව්‍යාපෘතිය යටතේ මො/මඩුල්ල මහා විද්‍යාලයේ ඉදිකිරීම් සඳහා ගෙවීම් කිරීමේදී රු. 75,716 ක්ද බිඳුනුවැව සේවා සංස්කරණ ආයතනයේ පසු අස්වනු තාක්ෂණ ගොඩනැගිල්ල ඉදි කිරීමේ කර්මාන්තයට ගෙවීම් කිරීමේදී රු.34,308 ක්ද පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් මොණරාගල පීලෝන් බංගලාවේ ලී වැටක් ඉදිකිරීමේ කර්මාන්තය සඳහා රු.11,959 කද වැඩිපුර ගෙවා තිබුණි.

2.18 **පළාත් පාලන ආයතන අධීකෂණය**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

පළාත් සභාවේ අධීක්ෂණය හා පාලනයට යටත් වන ඌව පළාත තුළ පිහිටි පළාත් පාලන බල මණ්ඩල 28 ක පහත සඳහන් ඌනතා සැලකිල්ලට ගත්විට එම අධීක්ෂණ කටයුතු සතුටුදායකව ක්‍රියාත්මක වී නොමැති බව නිරීක්ෂණය විය.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

ඌව පළාත තුල පිහිටි පළාත් පාලන ආයතන 28 ක් අතුරින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් නියමිත දිනට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුනේ ආයතන 06 ක් පමණි.

(ආ) හිඟ ආදායම්

(i) 2011 දෙසැම්බර් 31 දිනට සමාලෝචිත හා ඉකුත් වර්ෂ වෙනුවෙන් ඌව පළාතේ පළාත් පාලන ආයතනවලට ලැබිය යුතු වරිපනම් බදු හා වෙනත් ආදායම් රු.238,383,139 ක් හිඟව තිබුණි.

(ii) 1979 අංක 42 දරන මහ නගර සභා හා නගර සභා (සංශෝධිත) පනතේ සහ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 129 (2) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව පළාත් පාලන ආයතනවලට අයවිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු ආදායම් රු.134,558,141 ක් පළාත් පාලන ආයතන වෙත ලැබී නොතිබුණි.

(ඇ) නිකුත් කර තිබුණු අධිභාර සහතික වෙනුවෙන් අයවීමට ඇති මුදල්

වර්ෂය අවසානයට ඌව පළාතේ පළාත් පාලන බල මණ්ඩලවල නිලධාරීන්ට හා නියෝජිතයන්ට පනවා තිබුණු අධිභාර 74 ක් වෙනුවෙන් රු.6,971,291 ක් අයවීමට තිබුණි.

## 2.19 අභ්‍යන්තර විගණනය

මාර්ග නඩත්තුවට හා මාර්ග පුනරුත්තාපනය වෙනුවෙන් ව්‍යාපෘති 215 ක් සහ විශේෂ අවස්ථා සහ අවිච්ඡේද කර්මාන්ත සඳහා රු.මිලියන 300 ක් වෙන් කර තිබුණ අතර එම ප්‍රමාණය පළාත් සභාවේ මුළු මූලධන ප්‍රතිපාදනයෙන් සියයට 8.6 ක් විය. මෙම මූලධන වියදම් අධීක්ෂණය සඳහා ආයතනය තුල ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබූ අතර අභ්‍යන්තර විගණන වැඩසටහන් ද පිළියෙල කර නොතිබුණි.

## 2.20 සංයුක්ත සැලැස්ම

2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව 2011 වර්ෂයෙන් ආරම්භක ඉදිරි වර්ෂ තුනක් සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 2.21 විගණන කමිටු

පළාත් සභාවේ මූල්‍ය විචක්ෂණභාවය හා මූල්‍ය කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා පළාත් සභාවේ අමාත්‍යාංශ /දෙපාර්තමේන්තු 24 ක විගණන කමිටු පිහිටුවා නොතිබුණි.

## 3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් කළමනාකරණය

(ඇ) පළාත් සභා සංවර්ධන සැලැස්ම

(ඈ) අභ්‍යන්තර විගණනය

(ඉ) පළාත් පාලන බල මණ්ඩල අධීක්ෂණය

(ඊ) සේවක මණ්ඩල කළමනාකරණය

(උ) වත්කම් කළමනාකරණය

(ඌ) කොන්ත්‍රාත් කළමනාකරණය

(එ) බැංකු ගත කිරීම්